DEVELOPMENT LOTTERY

Enriching Your Life

# අභියෝග හමුවේ නැගී සිටිමින්



**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**

වාර්ෂික වාර්තාව 2021

*"විශිෂ්ඨ සාර්ථකත්වයක් අත්කර ගත් වසරක් සනිටුහන් කරමින් අපි ශ්‍රී ලාංකික ජන ජීවිතය කෙරෙහි තිරසාර බලපෑමක් ඇතිකර ඇත්තෙමු. අපි ඉදිරියට ගමන් කරන විට, සියලු ම ශ්‍රී ලාංකිකයින්ට අධ්‍යාපන අවස්ථා ලබාදීමට මෙන්ම ජනජීවිතය නගා සිටුවීමට ද දායක වෙමින් ජයග්‍රාහී වැඩපිළිවෙළක් ඉදිරිපත් කරන්නෙමු.*

*අපගේ නූතන පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් සහ අභිලාෂයන් සපුරාලීම සඳහා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් නව්‍ය වේදිකා හඳුන්වා දීම මගින් සාර්ථක වේදිකාවක් ගොඩනගා ගනිමින් අපි ඉදිරියට ගමන් කරන්නෙමු."*

# අන්තර්ගතය

| | |
|---|---|
| ආයතනික තොරතුරු | 04 |
| අපගේ දැක්ම සහ මෙහෙවර | 05 |
| අපගේ ඉතිහාසය සැකෙවින් | 06 |
| වැදගත් සංධිස්ථාන | 08 |
| ප්‍රධාන මූල්‍ය තොරතුරු | 10 |
| සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2021 | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය | 14 |
| අධ්‍යක්ෂ මණ්ඩලය - 2021 | 15 |
| වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය | 15 |
| කළමනාකරණ කණ්ඩායම | 16 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 17 |
| මෙහෙයුම් සමාලෝචනය | 18 |
| ලොතරැයි වර්ග පිළිබඳ දළ විශ්ලේෂණය | 20 |
| තිරසාරභාවය පිළිබඳ වාර්තාව | 26 |
| 2021.12.31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය | 30 |
| ආයතනික පාලනය | 32 |
| අවදානම් කළමනාකරණ වාර්තාව | 35 |
| විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව | 36 |
| මූල්‍ය වාර්තාව | 37 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 38 |
| විගණන වාර්තාව 2021 සහ කළමනාකාරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 46 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 53 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 54 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 55 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 56 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 57 |
| අංශමය වාර්තාව | 62 |
| අවසන් ගිණුම් පිළිබඳ සටහන් | 64 |
| දස වසරක සාරාංශය | 74 |

# ආයතනික තොරතුරු

**මණ්ඩලයේ නම**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නෛතික ස්වරූපය**
මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත නැමති පාර්ලිමේන්තු පනත යටතේ සංස්ථාගත කර ඇත.

**ආරම්භ කළ දිනය**
1983 ජනවාරි 19

**ලියාපදිංචි කාර්යාලය**
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 2

**දුරකථන අංක**
0112 333 546-8, 0114 824 824

**ෆැක්ස්**
0112 333 545

**විද්‍යුත් තැපෑල**
info@dlb.lk

**වෙබ් අඩවිය**
www.dlb.lk

**බදු හඳුනා ගැනීමේ අංකය**
409089844

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය**
අජිත් ගුණරත්න නාරගල මහතා - සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
එස්.ටී. කොඩිකාර මහතා - අධ්‍යක්ෂ
ඩබ්ලිව්. ඩී. සරත් කුමාර මහතා - අධ්‍යක්ෂ
කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය - අධ්‍යක්ෂ
ජෙනට් ජයවර්ධන මහත්මිය - නීතිඥ - අධ්‍යක්ෂ

**විගණක**
විගණකාධිපති

**බැංකුකරුවන්**
මහජන බැංකුව, ලංකා බැංකුව, සම්පත් බැංකුව,
හැටන් නැෂනල් බැංකුව

# දැක්ම

"ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනයක් බවට පත්වීම"

# මෙහෙවර

"නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ශනීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම."

# ඉලක්ක

- වෙළඳපොළ කොටස වැඩි කර ගැනීම.
- ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම.
- නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම.
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම.

# අපගේ මූලික සාරධර්ම

**සුපිලිපන්බව**
අප විසින් ඉදිරිපත් කරන ලොතරැයි හා අප ව්‍යාපාරික කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ.

**සුභවාදී ආකල්පය**
ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී.

**ප්‍රතිඵලදායක බව**
ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුහු දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති.

**නව්‍යතාවය**
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරඟකාරී වෙළඳපොළ වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති.

**කණ්ඩායම් හැඟීම**
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා එකාවන්ව කටයුතු කරති.

**විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම**
සංවර්ධන ලොතරැයි මණ්ඩල සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

# අපගේ ඉතිහාසය සැකවින්

අද දැයක ජීවිත එළිය කරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය එදා 1983 වර්ෂයේදී ස්ථාපිත කරනු ලබන්නේ සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ලෙසයි. මෙරට සුවහසක් ජන ජීවිත සඳහා ශක්තියක් වන ජනාධිපති අරමුදලත් දුෂ්කරතාවයන් මධ්‍යයේ උසස් අධ්‍යාපනයට යොමුවන සිසු දරුදැරියන්ට අත්වැසිල්ලක් වන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලත් සඳහා අරමුදල් සැපයීම එය පිහිටුවීමේ මුඛ්‍ය අරමුණු විය.

එම මුඛ්‍ය ධාරණාවන්ට අමතරව විවිධ මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන් රැසක් සඳහා අරමුදල් යෙදවීම පිණිස අඛණ්ඩ ආදායම් උත්පාදන යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කළ ආචාර්ය වික්‍රමසූරිය මහතා, ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය.

එම ඉල්ලීම වෙත යහපත් ප්‍රතිචාර දක්වමින් එවකට ජනාධිපතිව සිටි ජේ.ආර්.ජයවර්ධන මහතා විසින් රුපියල් මිලියන 2.2 ක මුදලක් ලබාදීමට කටයුතු කළ අතර අමාත්‍ය ලලිත් ඇතුලත්මුදලි මහතා විසින්ද ඒ හා සමාන මුදලක් මහපොළ උසස් අධ්‍යාපන අරමුදලෙන් ආයෝජනය කිරීමට එකඟ විය.

අරමුදලෙහි ස්ථිරසාරභාවය උදෙසා අලෙවි කරන ලද මුල්ම ලොතරැයිය ''සංවර්ධන ලොතරැයි'' යනුවෙන් නම් කරන ලද අතර එම උත්සාහයන් සියල්ල අවසානයේ ජනාධිපති අරමුදලටත්, මහපොළ භාරකාර අරමුදලටත් අරමුදල් සැපයීම අරමුණු කර ගනිමින් සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී.

වැදගත් ජයග්‍රහණ රැසක් අත්කර ගනිමින් සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය එතැන් සිට තම ගමන දියත් කළ අතර පළමු වසර තුළදී සාර්ථකව ආදායම් උපයා ගන්නට සමත් විය. එම ලාභයම වැඩි කොටස සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානයේ මව් පාර්ශවයන් වූ ජනාධිපති අරමුදලටත් මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලටත් ලබාදෙන ලදී. එතැන් පටන් අද දක්වාම සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම ලාභයන්ගේ වැඩි කොටසක් ජනාධිපති අරමුදල සඳහා බැර කරනු ලබයි. ජනාධිපති අරමුදල විසින් එම දායකත්වයන්ගෙන් 50% ක් මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදල වෙත වෙන් කරනු ලබයි.

1993 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය ''සංවර්ධන ලොතරැයි භාරය'' ලෙස නාමකරණය කළ අතර 1997 අගෝස්තු 12 වැනි දින වර්තමානයේදී අප භාවිතා කරන ''සංවර්ධන ලොතරැයි මණ්ඩලය'' ලෙස යළි ස්ථාපනය කරන ලදී.

''සංවර්ධන ලොතරැයිය'' නමින් හැඳින්වූ පළමු ක්ෂණික/සුරන ලොතරැයිපත රු.10/- බැගින් වූ මුදලකට දිවයින පුරා අලෙවි කරන ලද අතර, පැය 24ක් ඇතුළත සුපිරි ජයමළු ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහිකරන්නට සමත්වීම අද දක්වාම අපගේ ක්ෂණික ලොතරැයිපත් කෙරෙහි ජනප්‍රියත්වය වැඩි කිරීමට මග පෑදුවේය.

1987 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය විසින් ''ශනිදා වාසනාව'' නමින් ප්‍රථම වරට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලොතරැයියක් හඳුන්වා දෙන ලද අතර, එය ආරම්භයේදී සෙනසුරාදා දිනවල පමණක් දිනුම් ඇදිනු ලැබූ අතර වර්තමානයේදී එය දින හතේදීම දිනුම් අදිනු ලබයි. ක්ෂණික ලොතරැයි වලින් ජයග්‍රහණය හිමි නොවූ ටිකට්පත් සඳහාම විශේෂයෙන් සකස් කරන 1998 ජනවාරි 25 වන දින ආරම්භ කරන ලද වාසනා චක්‍රය වැඩසටහන ඉරිදා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශනය කරන ලදී.

එම වැඩසටහන් සඳහා ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබීම හේතුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1998 වසරේදී සංවර්ධන වාසනාව නමින් රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින දෙවන ලොතරැයිය හඳුන්වා දුන් අතර එය අඟහරුවාදා හා සිකුරාදා දිනවල විකාශය කරන ලදී. එහි අනන්‍ය අලෙවි ප්‍රස්තුතය සැලකිල්ලට ගනිමින් 2015 වර්ෂයේදී ලග්න සංකේත 12 සහිත සුවිශේෂ අංගය සමඟින් එය ලග්න වාසනා නමින් නැවත නම් කරන ලද අතර, මේ වන විට එය සතියේ දින හතේම දිනුම් අදිනු ලබන ආකර්ෂණීය ලොතරැයියකි.

නියමිත සුපිරි ජයමල්ල ත්‍යාග සහ සාමාන්‍ය මුදල් ත්‍යාග ලොතරැයි වලට අමතරව සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2004 ජනවාරි 26 වන දින ජයෝදා නමින් දිනුම් ඇදීමක් දියත් කළ අතර එය සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල රූපවාහිනිය ඔස්සේ විකාශනය විය. එහි සුපිරි ජයමල්ල රුපියල් මිලියන 10 ක ආරම්භක මුදලකින් ආරම්භ විය. ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී පියවරක් තබමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජයෝදා සුපිරි ජයමල්ල ජයග්‍රාහකයින්ට රුපියල් මිලියනයක ත්‍යාගය හෝ රුපියල් මිලියනයකට අධික වටිනාකමකින් යුතු නිවසක් තෝරා ගැනීමට අවස්ථා හිමිකර දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2009 අප්‍රේල් 10 වැනි දින ''ජන ජය'' ලොතරැයි එළිදැක්වූ අතර එය බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල විකාශනය කරන ලදී. වාසනාවන්තයින් සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා අංක 64 අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 04 සමග තවත් යන්ත්‍රයකින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැළපිය යුතුය. මෙහි සුපිරි ත්‍යාගය රුපියල් මිලියන 2.5 ක මුදලකින් ආරම්භ විය.

2012 ජූලි 11 වන දින ''සුපර් බෝල්'' ලොතරැයිය හඳුන්වා දීම මෙරට ලොතරැයි ඉතිහාසයේ පෙරළිකාර සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. රුපියල් කෝටි 03ක සුපිරි ජයමල්ලකින් ආරම්භ වූ මෙම සුවිශේෂී ලොතරැයිය එම කාල සීමාවේ මෙරට විශාලතම සුපිරි ත්‍යාග මුදල තිළිණ කළ ලොතරැයිය විය. අද එය දිනපතාම දිනුම් අදින ආකර්ෂණීය ලොතරැයි පතකි.

2016 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් නව ලොතරැයි වර්ග ගණනාවක් හඳුන්වා දුන්නේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2016 මැයි 14 වැනි දින සංවර්ධන ලක්ෂපති ලොතරැයිය දියත් කළ අතර එය මිලියන 5.6 ක සුවිශේෂී අලෙවියක් වාර්තා කළේය. එමෙන්ම රුපියල් මිලියන 75ක සුපිරි ජයමල්ලක් සමඟින් 2016 අප්‍රේල් 08 වැනි දින දියත් කරන ලද ''කෝටිපති ශනිදා'' ලොතරැයියෙහි ආරම්භක විකුණුම් වටයේදීම ලොතරැයිපත් මිලියන 4.4 ක් අලෙවි විය.

නව බලාපොරොත්තුවක් ඇතිකරවමින්, නව ආකර්ෂණයක් සහිතව මුදල් ත්‍යාග තුනක් සමඟින් හඳුන්වා දෙන ලද ''සංවර්ධන වාසනාව'' රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීම 2016 දෙසැම්බර් 12 වැනි දින නැවත දියත් කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලාංකික ලොතරැයි ඉතිහාසයේ සතියේ දින හතේදීම දිනුම් අදිනු ලබන පළමු ලොතරැයිය ලෙස

2017 අගෝස්තු 31 වැනි දින ''අද කෝටිපති'' ලොතරැයිය හඳුන්වා දෙන ලදී.

තවද ලොතරැයි ව්‍යාපාරයේ උන්නතිය උදෙසා නව තාක්ෂණය හා යාවත්කාලීන වෙමින් 2020 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම පාරිභෝගිකයින් වෙත ස්මාර්ට් දුරකථනය හරහා ලොතරැයි පතක් මිළදී ගැනීමේ ඉඩ හසර විවෘත කර දෙන්නේ ''DLB Sweep App" යෙදුම හඳුන්වා දෙමිනි. එම හඳුන්වා දීමත් සමග සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මෙරට නව වෙළඳපලක් ඉලක්ක කර ගනිමින් දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය වන ''සසිරි'' ලොතරැයිය හඳුන්වා දීම සිදුකරන ලදී.

ලොතරැයි නව්‍යකරණයේ තවත් මානයන් සොයා යන්නට යුහුසුළු වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේදී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහනටද නව මුහුණුවරක් හා රිද්මයක් එකතු කරන්නේ පැරණි දිනුම් ඇදීමේ වැඩසටහන් ආකෘතියට නිමා තබමිනි. එහිදී දිනුම් ඇදීම් වැඩසටහන් සියල්ලම එක දිගට එක පෙළට කෙටි කාලයක් ඇතුළත විකාශනය වන පරිදි ''DLB Lottery Show'' වැඩසටහන ක්‍රියාත්මක කිරීම 2021.03.01 දින ආරම්භ කරන ලදී. ඊට සමගාමීව DLB Lottery Show නමින් You Tube Channel යක්ද ආරම්භ කරන ලදී.

තවද දීර්ඝ කාලයක් ලොතරැයි පාරිභෝගිකයින් හට වාසනාව උදා කළ කෝටිපති කප්රුක ලොතරැයිය කෝටි 12 ආරම්භක සුපිරි ජයමල්ලක් සහ අතිශය ආකර්ෂණීය නව ත්‍යාග රටාවක් සමඟ ''කප්රුක'' ලෙස නව මුහුණුවරකින් සතියේ දින හතේම දිනුම් අදින ලොතරැයියක් ලෙස වෙළඳපලට නිකුත් කිරීම 2021 දෙසැම්බර් මස 02 වනදා සිදුකරන ලදී. එහි ප්‍රථම දිනුම් ඇදීම 2021.12.30 දින සිදුකළ අතර එතැන් සිට දිනකට දිනුම් අදිනු ලැබූ ලොතරැයිපත් සංඛ්‍යාව 06 ක් විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිහිටුවනු ලබන්නේ උත්තරීතර අරමුණු ද්විත්වයක් පෙරදැරි කර ගනිමිනි. ඒ ජනාධිපති අරමුදලටත්, මහපොළ භාරකාර අරමුදලටත් අරමුදල් සැපයීම අරමුණු කර ගනිමිනි. එබැවින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම සියලූ ලාභයන් බැර කරන්නේ ජනාධිපති අරමුදල වෙතයි. මෙරට ජනතාව ලොතරැයියක් වෙනුවෙන් වැය කරනු ලබන රුපියල් විස්ස නැවතත් වාසනාවක් බවට පත් කරමින් දිනුම් අවස්ථාද, රට වෙනුවෙන් යුතුකමද ඉටුකරන සංවර්ධන ලොතරැයි මණ්ඩලය පසුකළ අවුරුදු 38 ක කාලය තුළ ජනධිපති අරමුදලට ලබා දුන් දායකත්වය රුපියල් බිලියන තිහකට (30) අධිකය.

# වැදගත් සන්ධිස්ථාන

## 1983

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී.

## 1987

මෙරට ප්‍රථම වතාවට රූපවාහිනිය ඔස්සේ දිනුම් අදින ලද 'ශනිදා වාසනාව' ලොතරැයිය හඳුන්වා දීම.

## 1993

'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම

## 1997

'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් ලෙස 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් ස්ථාපනය කිරීම.

- **රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ළඟා කරගන්නා ලදී.**

## 1998

ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සූරන ලොතරැයිපත් සඳහා 'වාසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම නැවත දියත් කිරීම

- **ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 10 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ රු. 100 ක මුදලකට 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.**

## 1999

වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

## 2004

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව 'ජයෝදා' ලොතරැයිය දියත් කරන ලදී.

- **රුපියල් බිලියන 3 ක සමස්ත පිරිවැටුමක් අත් කරගන්නා ලදී.**

## 2008

අංක 356, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 යන ලිපිනයෙහි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී.

- **රුපියල් බිලියන 5 ක සමස්ත පිරිවැටුමක් අත්කර ගන්නා ලදී.**

**2010**

සුපිරි ජයමල්ලක් සමග 'ජන ජය' දිනුම් අදින ලොතරැයිය හඳුන්වා දීම

**2011**

'නියත ජය' දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම

**2012**

රුපියල් මිලියන 30 ක සුපිරි ජයමල්ලක් සමග 'සුපර් බෝල්' දිනුම් අදින ලොතරැයිය' හඳුන්වා දීම

**2013**

ඉහළම වටිනාකම සහිත ජයමල්ලක් සමග 'හයිවේ ඩ්‍රීම්' ලොතරැයිය හඳුන්වා දීම

**2014**

කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය දියත් කරන ලදි

**2016**

'සංවර්ධන ලක්ෂපති', 'කෝටිපති ශනිදා' සහ 'සංවර්ධන වාසනව' යන ලොතරැයි ආරම්භ කිරීම

**2017**

'අද කෝටිපති' ලොතරැයිය හඳුන්වා දීම

**2018**

IVR සහ කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ප්‍රතිඵල දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි

**2019**

'DLB Sweep App' යෙදවුම දියත් කිරීම

**2020**

'සසිරි' ඊ-ලොතරැයිය හඳුන්වා දීම

**2021**

ශ්‍රී ලංකාවේ ලොතරැයි ව්‍යාපාරයේ රු.මි. 120 ක් වූ ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමමින් 'කප්රුක' ලොතරැයිය නැවත හඳුන්වා දීම

# ප්‍රධාන මූල්‍ය තොරතුරු


















| මෙහෙයුම් ප්‍රතිඵල | 2021 | 2020 |
|---|---|---|
| ආදායම | 15,364,398,498 | 15,033,029,360 |
| දළ ලාභය | 6,523,212,978 | 6,369,222,716 |
| බදු පෙර ලාභය | 2,953,528,558 | 2,993,501,638 |
| බදු වියදම් | 83,440,185 | 10,921,555 |
| ශුද්ධ ලාභය | 2,875,951,381 | 3,018,654,911 |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය | 2,870,088,373 | 2,982,580,083 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | |
| **වත්කම්** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 1,158,675,958 | 1,236,649,449 |
| ස්ථාවර තැන්පතු | 1,142,259,436 | 1,338,731,761 |
| තොග | 43,102,269 | 32,590,632 |
| වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු වෙනත් | 150,441,764 | 92,541,218 |
| පෙර ගෙවීම් සහ තැන්පතු | 11,141,943 | 8,197,378 |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | 900,006,350 | 541,166,763 |
| **මුළු වත්කම්** | **3,405,627,719** | **3,250,373,201** |
| **වගකීම්** | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | (9,372) | 3,636,437 |
| අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ගෙවිය යුතු තැන්පතු | 37,664,881 | 36,390,381 |
| ගෙවිය යුතු ණය වවුචර් | 130,268,260 | 115,286,040 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 640,706,596 | 516,032,675 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | 564,219,473 | 685,860,083 |
| ගෙවිය යුතු ත්‍යාග | 962,793,104 | 578,618,857 |
| **හිමිකම්** | | |
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොළ භාරකාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | 448,131,648 | 698,558,607 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 614,729,237 | 614,729,237 |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම නැවත මිනුම් කිරීමේ ලාභය/(පාඩුව) | 2,723,891 | (3,139,116) |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **3,405,627,719** | **3,250,373,201** |
| **ලාභදායිතා අනුපාතය** | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 19% | 20% |
| දළ ලාභ අනුපාතය | 42% | 42% |
| **ද්‍රවශීලතා අනුපාතය** | | |
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.30 | 1 : 1.66 |
| සීඝ්‍ර (ද්‍රවශීලීතාවයෙන් යුත්) වත්කම් අනුපාතය | 1 : 1.27 | 1 : 1.64 |

# සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2021

පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයක් මධ්‍යයෙහි වුවද සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ක්‍රියාශීලී උපකාරක පද්ධතියේ සහාය ඇතිව තම ඉලක්ක වෙත සමීප වීමට හැකි වී තිබේ.

2021 වසර තුළදී මණ්ඩලය රු.මි. 15,730 ක පිරිවැටුමක් ලබා ගැනීමට සමත් වූ බව මණ්ඩලය සතුටින් වාර්තා කර සිටියි. එය පෙර වර්ෂයට සාපේක්ෂව 2% ක වර්ධනයක් වන අතර, අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුවද මණ්ඩලය ජනාධිපති අරමුදලට රු.මි. 2,870 ක දායකත්වයක් ලබා දුන්නේය.

| | 2020 | 2021 | වෙනස | % |
|---|---|---|---|---|
| ආදායම. (රු.මි.) | 15,400 | 15,730 | 330 | 2% |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි.) | 2,982 | 2,870 | -112 | -4% |
| ජයග්‍රාහකයින්ට ලබා දුන් ත්‍යාග මුදල් (රු.මි.) | 7,702 | 7,866 | 164 | 2% |

## වර්තමාන මූල්‍ය සමාලෝචනය - 2021

කොවිඩ්-19 වසංගතය ආරම්භ වූ අවස්ථාවේ සිට, මූල්‍ය ජයග්‍රහණ සම්බන්ධයෙන් විශාල අවිනිශ්චිතතාවයක් පැවතුණි. කෙසේ වෙතත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩව සිය ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය දිනා ගෙන ඇති අතර, අභියෝගාත්මක තත්ත්වයන් හේතුවෙන් විකුණුම් ද ඉහළ ගොස් තිබේ. විකුණුම් අයවැය ආදායම රු.මි. 16,161 ක් වුවද, තථ්‍ය ආදායම රු.මි. 15,730 ක් වේ. මෙම නිරීක්ෂණය වන විචලනය සිදුවී ඇත්තේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙනි. එමෙන්ම, ජනාධිපති අරමුදලට ලබා දුන් තථ්‍ය දායකත්වය රු.මි. 2,970 ක් වූ අතර, රජයට ලබා දුන් තථ්‍ය බදු දායකත්වය රු.මි. 448 ක් විය.

### අපගේ ජයග්‍රහණ

ඒ අනුව, විකුණුම් අයවැය සාධනය 97% ක් විය. පැවති කොවිඩ් වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද පසුගිය වර්ෂය පුරා ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය 123% කි.

### අපගේ කණ්ඩායම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයයේ උද්‍යෝගිමත් සහ ශක්තිමත් කණ්ඩායම අපගේ සාර්ථකත්වය පිළිබඳ කතාවේ ප්‍රධානතම අංගය වේ. අපගේ අලෙවිකරණ, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන අංශවල කණ්ඩායම් අපගේ මෙම ගමනට සවිය ලබා දෙන පිරිස වේ. ඔවුන්ගේ නව්‍ය චින්තනය අපගේ නිෂ්පාදන ප්‍රමුඛ මට්ටමකට රැගෙන යමින්, ලොතරැයි අත්දැකීමට නව මානයන් එක්කරමින්, මණ්ඩලය ඉහළ තලයකට ඔසවා තබා ඇත.

### ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- 2021 වර්ෂයේ දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක්වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් 21,527 ට ආසන්න සංඛ්‍යාවකට මූල්‍ය ආධාරයක් ලෙස රු. 2,500 ක් බැගින් ප්‍රදානය කරන ලද අතර, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඒ සඳහා වෙන් කරන ලද මුළු මුදල රු.මි. 53 කි.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොවිඩ්-19 වසංගතයෙන් ආරක්ෂාව සැලසීම සඳහා අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට මුහුණු ආවරණ 112,506 ක් බෙදා හැරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළේය.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විකුණුම් නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා 2021 වර්ෂයේ දී රු. 636,000 ක් වැය කරන ලදී.

- එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ සෞඛ්‍ය ගැටලු වලින් පෙළෙන සහ කොවිඩ් වයිරසය ආසාදනය වූ මණ්ඩලයේ ලොතරැයි අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් සඳහා සහ කොවිඩ් වසංගතය හේතුවෙන් මියගිය අයගේ පවුල්වල සාමාජිකයින් සඳහා 2021 වර්ෂයේදී රු. 2,500,000 ක් ප්‍රදානය කර ඇත.

### අනුග්‍රහයන් සඳහා දායකත්වය සැපයීම්

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර සඳහා 2021 වර්ෂයේ දී රු. 1,000,000 ක අනුග්‍රාහකත්වයක් ලබා දුන්නේය. එමෙන්ම, කොවිඩ්-19 වසංගතයෙන් ලෝකය මුදවා ගැනීම සඳහා අනුරාධපුර, මිරිසවැටිය චෛත්‍යය අභියස පවත්වන ලද සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය සඳහා රු. 477,000 ක් පිරිනමන ලදී. තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේ දී ගංගාරාම විහාරයේ නවම් පෙරහැර සඳහා රු. 250,000 ක් පිරිනැමුවේය. එයට අමතරව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ 75 වැනි උපසම්පදා උත්සවය සඳහා ද රු. 250,000 ක දායකත්වයක් ලබා දුන්නේය. මේ අනුව වැය කරන ලද මුළු මුදල රු. 1,977,000 ක් වේ.

## ඉදිරි දැක්ම

කෝටිපති කප්රුක ලොතරැයිය නව විශේෂාංග සහිතව රු. මි. 120 ක සුපිරි සුපිරි ජයමල්ලක්, රු. මි. 10 ක සුපිරි ජයමල්ලක් සහ රු. මි. 5 ක සුපිරි ජයමල්ලක් පිරිනමමින් 2021 දෙසැම්බර් 30 වැනි දින 'කප්රුක' නමින් වෙළෙඳපොළට නැවත හඳුන්වා දෙන ලදී. දිනපතා ලොතරැයිපත් වෙළෙඳපොළට නිකුත් කරනු ලැබේ.

## සමාප්ති සටහන

අප වෙත ලබා දුන් සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු මුදල් අමාත්‍යතුමාටත්, භාණ්ඩාගාර ලේකම්තුමාටත් මාගේ කෘතඥතාවය පුද කර සිටිමි.  පසුගිය වර්ෂවල මෙන්ම වර්තමානයේ ද ඉතා දක්ෂ හා කැපවීමෙන් යුතු අපගේ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව, දැනුම ලබා ගනිමින් සහ බෙදා ගනිමින් අපගේ විවිධ පාර්ශ්වකරුවන් සමග එක්ව කටයුතු කිරීමට ලැබීම මහඟු අත්දැකීමක් විය. අප කණ්ඩායම එකට එක්වී, අපගේ ප්‍රජාවන්ට සහාය වන අතරම අපගේ ගනුදෙනුකරුවන්ට ද සුවිශේෂී සේවාවක් සපයා දී ඇති අතර, අඛණ්ඩව තවදුරටත් එම සේවා සපයා දෙයි.

සියලු දිනුම් ඇදීම් අධීක්ෂණ මණ්ඩල සාමාජිකයන්ට, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලයට, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලේ කාර්ය මණ්ඩලයට, බෙදාහරින්නන්ට, අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට, ජනමාධ්‍ය වලට, බැංකුකරුවන්ට, සියලුම සේවා සපයන්නන්ට සහ සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු අපගේ විධායක කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් මම මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. එමෙන් ම, අපි අමතර උත්සාහයන් දරමින්, කැපවීමෙන් යුතුව කටයුතු කර, තම කාර්යභාරය මැනවින් ඉටු කරමින් අපගේ සාර්ථකත්වය උදෙසා දායකත්වය ලබා දෙන, සෑම කාණ්ඩයකටම අයත් අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ව ද අමතක නොකරන්නෙමු. අපි සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සිටීම අර්ථාන්විත කිරීමට ඔවුන් අපට සැබවින්ම සහාය වී ඇත.
තවද, අපගේ සේවාවන්ට අනුග්‍රහය දැක්වූ සියලුම පාරිභෝගිකයින්ට ද අපගේ ස්තූතිය පිරිනමන අතර, ඔවුන්ගේ අනුග්‍රහය නොලැබෙන්නට අපිට මෙම ජයග්‍රහණ ලබා ගැනීමට නොහැකි වනු ඇති බව ද සඳහන් කිරීමට කැමැත්තෙමු. එමෙන් ම, අප වෙත ලබා දුන් වටිනා දායකත්වය වෙනුවෙන් විගණන අධිකාරිවරයාට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද අපගේ ස්තූතිය පිරිනමන්නෙමු.

අවසාන වශයෙන්, මෙම ආයතනය කෙරෙහි තබා ඇති විශ්වාසය හා බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම පාර්ශවකරුවන්ට මම ස්තූතිවන්ත වන අතර ඉදිරි වර්ෂවලදී ද ඔබගේ අඛණ්ඩ සහයෝගය මම අපේක්ෂා කරමි.



**අජිත් ගුණරත්න නාරගල**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය කරනු ලැබේ. ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අරමුදල් සැපයීම මණ්ඩලයෙහි ප්‍රධාන අරමුණු වේ. කොවිඩ් වසංගතය හේතුවෙන් ඇතිවූ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදය මධ්‍යයෙහි වුව ද 2021 වර්ෂයේ දී ජනාධිපති අරමුදලට රු.මි. 2,870 ක දායකත්වයක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි වූ අතර, 2020 වර්ෂයට සාපේක්ෂව එය 4% ක පහළ යාමකි.

| | 2020 | 2021 | වෙනස | % |
|---|---|---|---|---|
| ආදායම. (රු.මි.) | 15,400 | 15,730 | 330 | 2% |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි.) | 2,982 | 2,870 | -112 | -4% |
| ජයග්‍රාහකයින්ට ලබා දුන් ත්‍යාග මුදල් (රු.මි.) | 7,702 | 7,866 | 164 | 2% |

ඉහත වගුවෙන් පැහැදිලි වන පරිදි, 2020 සහ 2021 අතර කාලයේ දී අලෙවියෙහි 2% ක වර්ධනයක් ද, ත්‍යාග පිරිනැමීමෙහි 2% ක වර්ධනයක් ද ඇති බව නිරීක්ෂණය වේ.

## කැපීපෙනෙන ජයග්‍රහණ

කොවිඩ්-19 වසංගතයත් සමග අපගේ ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් සපුරාලිය හැකි නව්‍ය ක්‍රම ගැන සිතීමට අපට සිදු විය. එබැවින් අපි පසුගිය වසර තුළ දී ඩිජිටල් අවකාශයේ වැදගත් සන්ධිස්ථාන කිහිපයක් ජය ගත්තෙමු. එම ජයග්‍රහණ වලින් කිහිපයක් පහත සඳහන් පරිදි වේ:

- පසුගිය වසර තුළදී අපගේ ගනුදෙනු කරුවන්ට වඩාත් වැඩිදියුණු කළ සහ ඩිජිටල්කරණය වූ සේවාවක් සපයා දීම පිණිස DLB Sweep App යෙදවුම හඳුන්වා දෙන ලදී. මෙම යෙදවුම හරහා පාරිභෝගිකයන්ට ලොතරැයි ප්‍රතිඵල පරීක්ෂා කර ගැනීමට අමතරව ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත්, බැංකු ගිණුම් ආදී ගෙවීමේ ක්‍රම මගින් ලග්න වාසනා, ශනිදා, සුපර් බෝල් සහ සසිරි ලොතරැයිපත් මිලදී ගැනීමේ පහසුකම ද සලසා දෙන ලදී. එයින් වර්ෂයකට පසුව, NBQSA 2021 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී DLB Sweep App යෙදවුමට "පාරිභෝගික කාණ්ඩයේ සිල්ලර වෙළඳාම සහ බෙදාහැරීම" යටතේ රිදී තිළිණයක් හිමිවිය. එමෙන්ම, මෙම යෙදවුම 'හොඳම ඩිජිටල්කරණ ක්‍රියාවලීන්ට පහසුකම් සලසන්නා' සම්මානය සඳහා ද නම් කරනු ලැබීම ආයතනයේ තවත් කැපීපෙනෙන ජයග්‍රහණයක් සනිටුහන් කරයි.
- ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම වැඩිදියුණු කිරීමට සමගාමීව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද, දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයි සන්නාමය වන සසිරි ලොතරැයිය එම තිළිණ ප්‍රදානෝත්සවයේදී ම 'ගෘහස්ත කාණ්ඩය' යටතේ කුසලතා සම්මානයක් දිනා ගැනීමට සමත් විය.
- දෛනික මූල්‍ය ආධාරයක් ලෙස අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට රු. 2,500 ක් බැගින් ලබා දෙන ලද අතර මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල රු. මි. 53 ක් විය. එමෙන්ම, අලෙවි නියෝජිතයින්ව සහ අලෙවි සහායකයින්ව කොවිඩ් රෝග යෙන් ආරක්ෂා කර ගැනීම පිණිස මුහුණු ආවරණ 112,506 ක් ඔවුන් අතර බෙදා දෙන ලදී. තවද, අලෙවි නියෝජිතයින්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවන් සඳහා රු. 636,000 ක ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී. විවිධ සෞඛ්‍ය ගැටලුවලින් පීඩා විඳි අලෙවි නියෝජිතයන් සහ අලෙවි සහායකයින් සඳහා සහ වෛරසය ආසානය වූ හෝ මියගිය අයගේ පවුලේ සාමාජිකයන් සඳහා රු. 2,500,000 ක් ප්‍රදානය කර ඇත.
- එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේ දී සුපිරි ජයමලු ජයග්‍රාහකයින් 54 දෙනෙකු ද බිහි කර ඇත.

අපට සහාය දැක්වූ අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, මුදල් අමාත්‍යතුමාටත්, අභියෝග මධ්‍යයෙහි වුවද අපගේ වාර්ෂික ඉලක්කය සපුරා ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කළ අපගේ කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අවංක ස්තූතිය පුද කර සිටිමි. අපගේ ස්තූතිය හිමිවිය යුතු තවත් බොහෝ දෙනෙකු සිටින අතර, අපගේ පාරිභෝගිකයින් වෙත අපගේ නිෂ්පාදන බෙදා හැරීම සඳහා මහඟු දායකත්වයක් ලබා දෙන අපගේ අලෙවි බලකායට, විශේෂයෙන් ම බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ට, අලෙවි නියෝජිතයින්ට, අලෙවි සහායකයින්ට අපගේ ස්තූතිය පුද කර සිටිමු.

අවසාන වශයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි තබා ඇති විශ්වාසය සහ බලාපොරොත්තුව වෙනුවෙන් අපගේ සියලුම ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට මාගේ අවංක ස්තූතිය පුද කර සිටිමි.

**ජෙනට් ජයවර්ධන**
(නීතිඥ)
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2021

**අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
2021.12.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**ජේ.එම්. හදානි ජයවර්ධන මහත්මිය**
ලේකම්,
වෙළඳ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2020.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා**
ප්‍රධාන මූල්‍ය නිලධාරී,
ජනාධිපති ලේකම් කාර්යාලය,
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2020.07.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය.
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2021.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**ජෙනට් ජයවර්ධන මහත්මිය**
(නීතිඥ)
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය

**අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
2021.12.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**එස්.ටී. කොඩිකාර මහතා**
ලේකම්,
වෙළඳ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2022.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**ඩබ්ලිව්. ඒ. සරත් කුමාර මහතා**
ලේකම්, ජනාධිපති අරමුදල
නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්, මුදල් අමාත්‍යාංශය.
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2022.08.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
අධ්‍යක්ෂ
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය.
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2021.06.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි

**ජෙනට් ජයවර්ධන මහත්මිය**
(නීතිඥ)
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2020.01.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි

# කළමනාකරණ කණ්ඩායම

01 **අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

02 **ඩබ්ලිව්.කේ.ඒ.ඒ. ජයරත්න මහතා**
සාමාන්‍යාධිකාරී

03 **ඩබ්.ඒ.වී.සී. සෝමරත්න මෙනවිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

04 **ඩී.ඩී.සී. දමින්ද මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

05 **කේ.එන්. බුලත්සිංහල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

06 **සුනිල් ජයරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)

07 **ටී. කසුන් ජයසූරිය මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

08 **නිශාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

09 **එස්.එම්.ඒ. වසන්ත උදයකුමාර මහතා**
අභ්‍යන්තර විගණක

10 **ආචාර්ය අසංකා එස්. ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ)

11 **පී.ඩී. මධුර හර්ෂණ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ)

12 **රෝහන ප්‍රසාද් රණසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සහ පරිපාලන)

13 **පී.ඩී.යූ. මලින්ත මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)

14 **සී.සී. අයිලප්පෙරුම මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්), වැඩ බලන

# කණිෂ්ඨ කළමනාකරුවන්

01 ඊ.ඩී.අයි.එන්.එස්. අබේරත්න මහතා
පරිපාලන නිලධාරී

02 ජේ.එම්.ඩී.ඒ ක්‍රිෂාන්ත මහතා
ප්‍රධාන ආරක්ෂක නිලධාරී

03 එම්.බී.එම්.එන්.කේ. බලගල්ල මහතා
කලාප කළමනාකරු

04 පී.ඒ.ආර්.එස්. රණතුංග මහතා
කලාප කළමනාකරු

05 එම්.කේ.ඒ.අයි. කමල්සිරි මහතා
කලාප කළමනාකරු

06 අයි.ඩී. පත්ම කුමාරසිරි මහතා
කලාප කළමනාකරු

07 ඩී.එම්.බී.එල්. මහින්ද මහතා
කලාප කළමනාකරු

08 එම්.එල්. ගෞරි කෞශල්‍යා මහත්මිය
කලාප කළමනාකරු

09 ආර්.ඒ. සුනිල් රත්නායක මහතා
කලාප කළමනාකරු

10 ආර්.එම්.යු.එස්. කුමාර මහතා
කලාප කළමනාකරු

11 එන්.වී. ඉන්දික උපුල් මහතා
ගිණුම් නිලධාරී

12 ආර්.ඩී.සී. රාජපක්ෂ මහත්මිය
ගිණුම් නිලධාරී

13 එම්.ඒ.එල්.එන්. ගුණසේකර මහත්මිය
ගිණුම් නිලධාරී

14 ආර්.ඒ.ඩබ්.පී. රූපසිංහ මහත්මිය
ගිණුම් නිලධාරී

15 යූ.පී. ඉලේපෙරුම මහතා
පද්ධති / වැඩසටහන් විශ්ලේෂක

16 සී. එන්. තෙවරප්පෙරුම මහත්මිය
මානව සම්පත් නිලධාරී

17 බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා
ප්‍රසම්පාදන නිලධාරී

18 පී. ප්‍රසන්න ගෝකුල ප්‍රනාන්දු මහතා
ප්‍රවාහන නිලධාරී

19 පී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය
අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී

# මෙහෙයුම් සමාලෝචනය

## 2021 වර්ෂයේ අලෙවි කටයුතු පිළිබඳ සුවිශේෂී කරුණු

2020 වර්ෂයේ පැවැති අභියෝගාත්මක තත්ත්වයන්ගේ බලපෑම 2021 වර්ෂය ආරම්භ වන විට යම් තරමකට පහව යාමත් සමඟ 2021 වර්ෂයේ ප්‍රථම කාර්තුව තුළ ලොතරැයි අලෙවිය පසුබෑසීමකින් තොරව යහපත් මට්ටමක පැවතීය. නමුත් මුල් කාර්තුව අවසන් වීමත් සමඟම නැවතත් උද්ගතවූ කොරෝනා ව්‍යාප්තිය හේතුවෙන් ලොතරැයි අලෙවිය හා අලෙවි කටයුතු පසුබෑමකට ලක් විය.විශේෂයෙන්ම තුන්වන කාර්තුව වන විට රට නැවතත් සංචරණ සීමාවන්ට ලක් කළ අතර ඒ කාලසීමාව තුළ ලොතරැයි අලෙවිය සම්පූර්ණයෙන්ම අත්හිටුවීමට සිදු විය. එම තත්ත්වය හේතුවෙන් දෙවන හා තෙවන කාර්තු වල ලොතරැයි අලෙවියෙහි පසුබෑමක් සිදු වූ අතර නැවත රට විවෘත කිරීමත් සමඟම 2021 වර්ෂයේ හතරවන කාර්තුව වඩාත් සාර්ථක කර ගැනීමට අප කටයුතු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස අඩපණ වී තිබූ ලොතරැයි අලෙවිය යම් යහපත් මට්ටමකට ගෙන ඒමට හැකි විය.
ලොතරැයි අලෙවියෙහි තවදුරටත් වර්ධනය උදෙසා දිනකට දිනුම් අදිනු ලබමින් තිබූ ලොතරැයිපත් පහක සංඛ්‍යාව ලොතරැයිපත් හය දක්වා වැඩි කිරීම 2021 වර්ෂයේ අග භාගයේදී සිදුකරන ලදී.

2021 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පහත අලෙවි ප්‍රවර්ධන ක්‍රියාදාමයන් තුලින් අලෙවි කටයුතු වර්ධනය කරගැනීමට හැකි විය.

## 01. ප්‍රවර්ධන වැඩසටහන්

### • ලග්න වාසනාව

ලග්න වාසනාව ලොතරැයිය සඳහා ''සුපිරි ධන යෝගය'' නමින් 2021 පෙබරවාරි 25 (බ්‍රහස්පතින්දා) විශේෂ දිනුම් ඇදීමක් පැවැත්විණි. මෙම විශේෂ දිනුම් ඇදීම වෙනුවෙන් ලොතරැයිපත් මිලියන 3.4 ක අලෙවියක් පෙන්නුම් කරන ලදී. 2021 මාර්තු 23 (අඟහරුවාදා) ''සුපිරි ධන යෝගය'' නමින් තවත් දිනුම් ඇදීමක් පවත්වූ අතර මෙහිදී මිලියන 3.5 ක ටිකට් පත් අලෙවියක් සිදු විය. 2021 අප්‍රේල් 09 (සිකුරාදා) ''සුපිරි ධන යෝගය'' නමින් තවත් දිනුම් ඇදීමක් පවත්වා ඇති අතර මෙහිදී මිලියන 3.6 ක ටිකට් පත් අලෙවියක් සිදු විය.

තවද ලග්න වාසනාව ලොතරැයිය වෙළඳපලේ ප්‍රමුඛ ලොතරැයිය බවට පත් කිරීමේ අරමුණින් 2021 පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසවල විකුණුම් කණ්ඩායම සඳහා දිරි දීමනාවක් ලබා දුන් අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස ලග්න වාසනාව ලොතරැයිපතෙහි දෛනික අලෙවිය ලොතරැයිපත් 1.2 දක්වා 18% කින් ඉහළ යන ලදී.

### • අද කෝටිපති

2021 ජනවාරි 27වන දින (බදාදා) අද විශේෂ කෝටිපති නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත්වූ අතර මෙම දිනුම් ඇදීම මඟින් ලොතරැයිපත් මිලියන 1.7 ක අලෙවියක් වාර්තා විය. අද කෝටිපති ලොතරැයිපතෙහි ඕනෑම අංක 1ක් හා ඉංග්‍රීසි අක්ෂරයට රු.40 ත්‍යාගය රු.100 දක්වා සහ ඕනෑම අංක 3කට රු.1,000 ත්‍යාගය රු.2,000 දක්වා වැඩි කිරීම 2021 මැයි 01 දින සිට සිදු විය.

### • කප්රුක

කෝටිපති කප්රුක ලොතරැයිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2021 දෙසැම්බර් 30 වන දින (බ්‍රහස්පතින්දා) සිට 'කප්රුක' ලෙස නව මුහුණුවරකින් රු. කෝටි 12ක කප්රුක සුපිරි කෝටිපති ජයමල්ලක්, රු.ලක්ෂ 100ක කප්රුක කෝටිපති ජයමල්ලක් සහ රු.ලක්ෂ 50ක කප්රුක මිලියනපති ජයමල්ලක් සමඟ සතියේ දින 07ම හඳුන්වා දීම සිදු වූ අතර මීට සමගාමීව 2021 දෙසැම්බර් 30 වන දින (බ්‍රහස්පතින්දා) 785 වන වාරයේ ''පවර් ප්ලේ'' නමින් විශේෂ දිනුම් ඇදීමක් පැවැත් වූ අතර මෙහිදී මිලියන 4 ක වාර්තාගත ටිකට් පත් අලෙවියක් සිදු විය. මෙම අලෙවිය මෙම වසරේ වැඩිම ටිකට් පත් අලෙවිය ලෙස වාර්තා විය.

### • සසිරි

සසිරි ලොතරැයිපත් ටිකට්පත් දිනුම් ඇදීම බදාදා සහ සෙනසුරාදා දිනවල සිදු වූ අතර 2021 දෙසැම්බර් 30 වන දින (බ්‍රහස්පතින්දා) සිට 'සසිරි' සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් එය සතියේ දින 03ක්, අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා දිනවල දිනුම් ඇදීම වෙනස් කරමින් කාලසටහන සංශෝධනය කරන ලදී. මීට සසිරි ලොතරැයිපතෙහි ඕනෑම අංක 2ක් සඳහා රු.100 ලබා දීම රු.200 දක්වා වැඩි කිරීම 2021 දෙසැම්බර් 31 දින සිට සිදු විය.

## 02. 2021 වර්ෂය සඳහා නව බෙදාහැරීමේ නියෝජිතයින් සහ අලෙවි නියෝජිතයින් පත් කිරීම.

| දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය | නව බෙදාහැරීමේ නියෝජිතයින් | නව අලෙවි නියෝජිතයින් |
|---|---|---|---|
| 01 | කොළඹ | 03 | 12 |
| 02 | කළුතර | 01 | 03 |
| 03 | නුවර | | 10 |
| 04 | මාතලේ | 01 | 04 |
| 05 | නුවරඑළිය | | 01 |
| 06 | ගාල්ල | | 01 |
| 07 | මාතර | | 05 |
| 08 | හම්බන්තොට | | 02 |
| 09 | යාපනය | | 01 |
| 10 | මන්නාරම | | 01 |
| 11 | වව්නියාව | 01 | 07 |
| 12 | මඩකලපුව | | |
| 13 | අම්පාර | | 01 |
| 14 | ත්‍රිකුණාමලය | | |
| 15 | කුරුණෑගල | 01 | 10 |
| 16 | පුත්තලම | | 03 |
| 17 | අනුරාධපුර | 01 | 01 |
| 18 | පොළොන්නරුව | | |
| 19 | බදුල්ල | | 03 |
| 20 | මොණරාගල | | 00 |
| 21 | රත්නපුර | | 05 |
| 22 | කෑගල්ල | 01 | 07 |
| 23 | ගම්පහ | | 10 |
| 24 | කිලිනොච්චි | | |
| 25 | මුලතිව් | | 01 |
| | | 09 | 88 |

## 03. අලෙවි නියෝජිතයන් සහ අලෙවි සහායකයින් සඳහා වූ විශේෂ වැඩසටහන්

- 2021 වසරේ කොරෝනා උවදුර නිසා පීඩාවට පත් 21,527 ක් පමණ ලොතරැයි අලෙවි නියෝජිතයින් හා විකුණුම් සහායකයින් සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. මිලියන 53ක මූල්‍යාධාර මුදලක් එක් අයෙකුට රු.2500 බැගින් ලබා දෙන ලදී.

- සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් කොරෝනා උවදුරින් ආරක්ෂා වීම සඳහා අලෙවි නියෝජිතයින් සහ විකුණුම් සහායකයින් සඳහා මුහුණු ආවරණ 112,506 ක් බෙදා හැරීමේ ව්‍යාපෘතියක් දියත් කරන ලදී.

- විශ්ව විද්‍යාල වරම් ලබා සිටින සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ දූ දරුවන් සඳහා 2021 වර්ෂයේ රු.636,000 ක මුදලක් ලබා දීමට වෙන් කර ඇත.

- විවිධ රෝගාබාධ වලට ලක් වී සිටින, කොරෝනා උවදුරට ගොදුරු වූ සහ මරණයට පත්වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් සහ විකුණුම් සහායකයින් වෙනුවෙන් 2021 වර්ෂයේ රු.2,500,000 ලබා දෙන ලදී.

## 04. අනුග්‍රාහකත්වයන් සහ දායකත්වයන්

- 2021 වර්ෂයේ රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර වෙනුවෙන් රු. 1,000,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- කොවිඩ් 19 රෝගය මිහිතලයෙන් දුරුවේවායි ප්‍රාර්ථනා කරමින් අනුරාධපුර මිරිසවැටිය රජමහා චෛත්‍යරාජයාණන් අභියස පවත්වන ලද සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය වෙනුවෙන් රු.477,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- 2021 වර්ෂයේ ගංගාරාමයේ නවම් පෙරහැර වෙනුවෙන් රු. 250,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

- මීට අමතරව 2021 වර්ෂයේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 72 උපසම්පදා මහෝත්සවය වෙනුවෙන් රු. 250,000 ක අනුග්‍රාහක මුදලක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කරන ලදී.

# ලොතරැයි වර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක්

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල හරහා අධ්‍යාපනය සහ ප්‍රජා ව්‍යාපාර සඳහා අරමුදල් සපයා දෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි නිෂ්පාදන වර්ග දෙකක් තිබේ. නිෂ්ක්‍රිය ලොතරැයි සහ ඩිජිටල් ලොතරැයි එම වර්ග දෙක වේ. ඩිජිටල් ලොතරැයිය “DLB Sweep” ජංගම යෙදවුම හරහා අලෙවි කරනු ලැබේ.

- **දිනුම් ඇදීමේ ලොතරැයි** - ලොතරැයිපතේ ඇති අංක ලොතරැයිය විසින් දිනුම් අදිනු ලබන අංක සමග ගැළපීම මගින් මෙම ක්‍රීඩාව සිදු කරනු ලැබේ.
- **සූරන ලොතරැයි** - පූර්වයෙන් තීරණය කරන ලද ත්‍යාග තිබේද යන්න හෙළි කර ගැනීම සඳහා කඩදාසි ලොතරැයිපතෙහි ඇති ක්ෂීර ස්තරය සූරා ඉවත් කිරීම මගින් දිනුම අදිනු ලැබේ.
- **සන්නාම ලැයිස්තුව** -

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

සඳුදා / අඟහරුවාදා / බදාදා / බ්‍රහස්පතින්දා / සිකුරාදා / සෙනසුරාදා සහ ඉරිදා

බ්‍රහස්පතින්දා / සෙනසුරාදා

සඳුදා / බදාදා

අඟහරුවාදා / සිකුරාදා / ඉරිදා

## 01. අද කෝටිපති



- **නිෂ්පාදනයේ දැක්ම**

  වෙළඳපොළ ප්‍රමුඛයා වීම සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත් වීම

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
  ලොතරැයි වර්ණ : රතු, ලා නිල්, රෝස, තද නිල්, දම්, කහ සහ කොළ
  ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 50,000,000.00 |

## 02. ශනිදා



- **නිෂ්පාදනයේ දැක්ම**

  සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හතෙහි ම) මාර්ගගත නොවන ලොතරැයි දිනුම් ඇදීම මගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනයක් බවට පත් වීම.

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  සතියේ දින හතෙහි ම පවත්වනු ලබන, ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ප්‍රමුඛතම ලොතරැයියක් ලෙස අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
  ලොතරැයි වර්ණ : තද නිල්, ලා නිල්, දම්, රතු, තැඹිලි, කොළ, සහ රෝස
  ආරම්භක ජයමල්ල : රු. 30,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 30,000,000.00 |

## 03. කප්රුක



- **නිෂ්පාදනයේ දැක්ම**
  ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයිය නිෂ්පාදනය බවට පත්වීම.

- **නිෂ්පාදනයේ මෙහෙවර**
  ජැක්පොට් ත්‍යාගය දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව ප්‍රියකරන ලොතරැයි නිෂ්පාදන තෝරා ගැනීම බවට පත් වීම

- **ලොතරැයි විස්තර**
  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම) ලොතරැයි වර්ණ : ලා නිල්, රෝස, කොළ, තැඹිලි, ඉන්ඩිගෝ, රතු සහ කහ
  ආරම්භක ජයමල්ල : රු. 120,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.20.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.100.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.1,000.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| අංක හතර සමග සුපිරි අංකය | රු.5,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.10,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර සහ සුපිරි අංකය | රු.120,000,000.00 |

## 04. ලග්න වාසනාව



- **නිෂ්පාදනයේ දැක්ම**
  ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන ප්‍රමුඛතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම

- **නිෂ්පාදනයේ මෙහෙවර**
  ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ බලාපොරොත්තුව වන ලොතරැයි නිෂ්පාදනය

- **ලොතරැයි විස්තර**
  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම) ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, නිල්, ලා නිල්, දම්
  ආරම්භක ජයමල්ල : රු. 2,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.20.00 |
| ඕනෑම ලග්න සංකේතයක් | රු.20.00 |
| ඕනෑම අංක දෙකක් | රු.100.00 |
| ඕනෑම අංක තුනක් | රු.1,000.00 |
| අංක හතර | රු.500,000.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක එකක් | රු.60.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ලග්න සංකේතය සමග ඕනෑම අංක දෙකක් | රු.10,000.00 |
| ලග්න සංකේතය සමග අංක හතර | රු.2,000,000.00 |

## 05. සුපර්බෝල්




- **නිෂ්පාදනයේ දැක්ම**

  ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
  ලොතරැයි වර්ණ : දම්, ලා නිල්, තැඹිලි, කොළ, රෝස, තද නිල් සහ රතු
  ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 50,000,000.00 |

## 06. සංවර්ධන වාසනාව




- **නිෂ්පාදනයේ දැක්ම**

  සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී, විශ්වාසනීය සහ ගෞරවනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින්, දිනුම් අදින දින දෙකෙහි ම ජනප්‍රියතම නිෂ්පාදනයක් බවට පත් වීම.

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයක් පිරිනමමින්, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම අන්තර්ජාල නොවන ලොතරැයිය බවට පත්වීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : බ්‍රහස්පතින්දා/සෙනසුරාදා

  ලොතරැයි වර්ණ : නිල් සහ රතු
  ආරම්භක ජයමල්ල : රු. 10,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| දෛව අංකය | රු. 20.00 |
| ඉංග්‍රීසි අකුර | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 50,000.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක දෙකක් | රු. 500.00 |
| දෛව අංකය සමග ඕනෑම අංක තුනක් | රු. 500,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 100.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 500.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 100,000.00 |
| අංක එකක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු. 200.00 |
| අංක දෙකක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු. 10,000.00 |
| අංක තුනක්+දෛව අංකය+ඉංග්‍රීසි අකුර | රු.10,000,000.00 |

## 07. ජයෝදා




- **නිෂ්පාදනයේ දැක්ම**

  සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බදාදා දිනවල ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත් වීම.

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් පිරිනමමින්, සඳුදා සහ බදාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : සඳුදා සහ බදාදා
  ලොතරැයි වර්ණ : කහ සහ තැඹිලි
  ආරම්භක ජයමල්ල : රු. 20,000,000/-

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | Prize (Rs.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු. 20.00 |
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 100.00 |
| ඕනෑම අංක තුනක් | රු. 2,000.00 |
| අංක හතර | රු. 1,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු. 40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු. 1,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු. 50,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු. 20,000,000.00 |

## 08. සසිරි




- **නිෂ්පාදනයේ දැක්ම**

  ප්‍රමුඛ පෙළේ විද්‍යුත් ලොතරැයි සන්නාමයක් බවට පත්වීම.

- **නිෂ්පාදනයේ මෙහෙවර**

  නව්‍ය, අධි තාක්ෂණික ලොතරැයි ක්‍රමයක් හඳුන්වා දීම මගින් මෙතෙක් ප්‍රයෝජනයට නොගත් නව වෙළඳපොළක් නිර්මාණය කිරීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

- **ලොතරැයි විස්තර**

  දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, සිකුරාදා සහ ඉරිදා
  ලොතරැයි වර්ණ : දම්, ලා දුඹුරු සහ කොළ

- **ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු. 20.00 |
| ඕනෑම අංක දෙකක් | රු. 20.00 |
| ඕනෑම අංක තුනක් | රු. 100.00 |

## 09. ක්ෂණික ලොතරැයිය

- **හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ශ්‍රී ලංකාවට ක්ෂණික ලොතරැයියක් හඳුන්වා දෙන ලදී. වෙළඳපොළට හඳුන්වා දෙන විට එය මෙරටට නව්‍ය සංකල්පයක් විය.

- **සන්නාමයේ දැක්ම**

මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

- **සන්නාමයේ මෙහෙවර**

ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස නව්‍ය ත්‍යාග ව්‍යුහයක් හඳුන්වා දීම සහ මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණය හරහා නව මුහුණුවරක් හඳුන්වා දීම.

- **තරගකාරී පසුබිම**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්ෂණික ලොතරැයි වෙළඳපොළට හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලදී: සෙවණ සහ සමෘද්ධි එම ලොතරැයි දෙක විය.

සෙවණ ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික සූරන ලොතරැයියේ සෘජු තරගකරු විය. සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනම ම ආයතනයක් ස්ථාපනය කරන ලදී. එම නිසා ජනතාව එය මෙරට තිබෙන ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනයක් ලෙස පිළිගත්හ.



**2021 වර්ෂයේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ තිළිණ ප්‍රදානෝත්සවයේදී DLB sweep App යෙදවුමට රිදී සම්මානයක් හිමිවිය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සාඩම්බරයෙන් ඉදිරිපත් කරන ලද DLB Sweep App යෙදවුම නවීන තාක්ෂණය සමඟ ඒකාබද්ධ කර, එමගින් සාම්ප්‍රදායික ලොතරැයි ක්‍රමය ඉක්මවා යමින් NBQSA 2021 ජාතික තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සම්මාන උළෙලෙහි “පාරිභෝගික කාණ්ඩයේ සිල්ලර වෙළඳාම සහ බෙදාහැරීම” යටතේ රිදී සම්මානයක් දිනා ගත්තේය. එමෙන් ම, DLB Sweep App යෙදවුම “හොඳම ඩිජිටල්කරණ ක්‍රියාවලි සක්‍රීය කරන්නා” කාණ්ඩයේ සම්මානය සඳහා නම් කර නිර්දේශ කර ඇති අතර එය මණ්ඩලයෙහි තවත් කැපී පෙනෙන ජයග්‍රහණයක් සනිටුහන් කරයි.

ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීමට සමගාමීව සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලුතින් හඳුන්වා දෙන ලද, දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයි සන්නාමය වන සසිරි ලොතරැයිය එම තිළිණ ප්‍රදානෝත්සවයේදීම "In House" කාණ්ඩය යටතේ කුසලතා සම්මානයක් දිනා ගැනීමට සමත්විය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සභාපති අජිත් ගුණරත්න නාරගල, සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) මධුර හර්ෂණ, සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) ආචාර්ය අසංකා ගුණසිංහ සහ පද්ධති විශ්ලේෂක උමේෂ් ඉලේපෙරුම යන මහත්ම මහත්මීන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගි වූහ.



# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

"සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර, මණ්ඩලය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි."

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක තුනක කාලය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලය මූලික වශයෙන් ම තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස පැවත තිබේ. ආරම්භයේ සිටම සංවර්ධන ලොතරැයි මණ්ඩලය හුදෙක් එහි ආසන්නතම පාර්ශ්වකරුවන්ගේ ශුභසිද්ධියට වඩා වැඩි යමක් සැලකිල්ලට ගනිමින් තරගකාරී ව්‍යාපාර ක්‍රමෝපාය සකස් කිරීම සමාජයේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමග නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපාය මාර්ග, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැපවී සිටින අතර එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලාංකිකයින්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මගින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි සමාජ වගකීමට ව්‍යාපාරයේ, පාරිභෝගිකයින්ගේ සහ ලොතරැයි ජයග්‍රාහකයින්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමර්ග මෙන් ම ප්‍රජා සත්කාර වැඩසටහන් ද ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ක්ෂණික ලොතරැයි පවත්වයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට ප්‍රතිවරණය වෙයි.

## අපගේ මූලික සාරධර්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය තෝරා ගෙන ඇති ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක් සමග කැපවීම, විශ්වාසනීයත්වය සහ නිර්දේශය ලබා දීම සඳහා මණ්ඩලයට පැහැදිලි අභිලාෂයක් ඇත.

මෙම අභිලාෂය සපුරාලීම සරල දෙයක් නොවන අතර එය බොහෝ දුරට අපි තිරසාර ආකාරයකට වගකීම් සහගත ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටින බවට සැකයකින් තොරව සනාථ කිරීමට අපිට ඇති හැකියාව මත රඳා පවතියි.

අපගේ කැපවීමෙන් යුතු දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සැලකූ විට, ඔවුන් අපට අති මහත් සහයෝග යක් ලබා දී ඇති බව සඳහන් කළ යුතුය. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අපි මහත් සේ වෙහෙසෙන්නේ එහෙයිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අපි අපගේ සේවක පිරිස සඳහා ආයෝජනය කරන්නේ අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය රඳා පවතින්නේ තම රැකියාව පිළිබඳව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කර ගෙන සිටින බැවිනි.

එමෙන්ම, අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීමට, කර්මාන්තයේ රැකියා නිර්මාණය කිරීම සහ ජනාධිපති අරමුදලට හා මහපොළ භාරකාර අරමුදලට දායකත්වය ලබා දීම තුළින් සෞඛ්‍ය රැකවරණය සහ අධ්‍යාපනය වැනි වැදගත් සේවාවන් සපයා දීමට සහාය වීම සඳහා ආදායම වැඩි කර ගැනීමට අරමුණු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සපයා දීමේදී පාරිභෝගිකයින් කෙරෙහි වඩාත් නැඹුරුවී සිටින අතර, සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

## පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සේවකයින් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය හරහා ඵලදායී ප්‍රජා සහාය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. DLB Sweep App යෙදවුම හඳුන්වා දීම සහ සසිරි ඊ-ලොතරැයිය හා SMS ලොතරැයි සේවා වැනි නිෂ්පාදන හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ.

ඩිජිටල්කරණය හරහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් පෘථිවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවය වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. මෙම වාර්තාව තුළින් අපි සෑම වර්ෂයකදී ම මෙම ක්ෂේත්‍රයන්හි අපි අත් කර ගනිමින් සිටින ප්‍රගතිය පෙන්වා දෙන අතර ඉදිරි වර්ෂය සඳහා අපගේ අරමුණු ද ප්‍රකාශ කරන්නෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ලොතරැයි නිෂ්පාදන හා ත්‍යාග තුළින් ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතවලට ස්ථාවර හා තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැපවූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමාජ, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර ඇති බව මෙම ක්‍රියාකාරකම් මගින් අවධාරණය කෙරෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරයි.

## ආයතනික සමාජ වගකීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අපට අවශ්‍ය වන්නේ අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති මත පදනම්ව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමටය. එබැවින්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය අර්ථවත්, දිගුකාලීන හවුල්කාරිත්වයන් හරහා ප්‍රජාවට දායක වීම සහ පාරිසරික වශයෙන් තිරසාර ලෙස ව්‍යාපාර පවත්වාගෙන යාම කෙරෙහි අවධානය යොමු කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලට, සත්කාරක ප්‍රජාවන්ට සහ ප්‍රාදේශීය පුණ්‍යායතනවලට අරමුදල් සපයා දෙමින් ශ්‍රී ලංකාවේ අපගේ ජනතාවගේ ජීවිත පොහොසත් කරයි. ලොතරැයි අලෙවිකරුවන්ගේ සමස්ත දාමයට ම සහාය සපයා දෙමින් පුද්ගලයින්ගේ ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම අරමුණු කර ගත් සමාජ ව්‍යාපාර වැඩසටහන් කිහිපයක් දියත් කිරීමට ද සංවර්ධන ලොතරැයි මණ්ඩලයට හැකි විය.

## සේවා නියුක්තිය සවිබල ගැන්වීම සඳහා අප විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත

1. කොවිඩ් සහනාධාර ලෙස අලෙවි සහායකයින් අතර රු. මිලියන 53 ක මුදලක් බෙදා හරින ලදී.

2. සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි නියෝජිතයින්ට සහ අලෙවි සහායකයින්ට කොවිඩ් රෝගයෙන් ආරක්ෂා කර ගැනීම පිණිස ඔවුන් අතර මුහුණු ආවරණ 112,506 ක් බෙදා දීමේ වැඩසටහනක් දියත් කරන ලදී.

3. එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ සෞඛ්‍ය ගැටලු වලින් පෙළෙන සහ කොවිඩ් වෛරසය ආසාදනය වූ මණ්ඩලයේ ලොතරැයි අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් සඳහා සහ කොවිඩ් වසංගතය හේතුවෙන් මියගිය අයගේ පවුල්වල සාමාජිකයින් සඳහා 2021 වර්ෂයේදී රු. 2,500,000 ක් ප්‍රදානය කර ඇත.

## අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබූ දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා 2021 වර්ෂයේ දී රු. 636,000 ක් වැය කරන ලදී. මහපොළ භාරකාර අරමුදල හරහා අපගේ සමාජයේ සිටින ආර්ථික දුෂ්කරතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම මගින් අපි සිසුන්ගේ ජීවිතවල බලපෑමක් ඇති කිරීම සඳහා අර්ථාන්විත දායකත්වයක් සපයා දී ඇති ආකාරය පිළිබඳ අපගේ ප්‍රතිලාභීන් ජීවමාන සාක්ෂියක් සපයා දෙයි.

## මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාර්ශෝගික සම්බන්ධතා ගොඩනැගීමේදී
අපගේ සේවකයින්ගේ වැදගත් කාර්යභාරය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා ඇඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබා දෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

## කාර්ය මණ්ඩල සංවර්ධන අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම සහ දිරිගැන්වීම

- ශ්‍රම බලකා සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනය දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.

- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ වෙනුවෙන් ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.

- සමාගමේ ක්‍රමෝපායික දිශාව පිළිබඳව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටින බව සහතික කිරීම.

## පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩසටහන / වැඩමුළුව | සහභාගීවූවන්ගේ නම් | පුහුණු කාලය | ස්ථානය |
|---|---|---|---|
| ලිපිගොනු කළමනාකරණය | කළමනාකරණ සහාකාරවරුන් (37) | දින 01 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යංශය |
| සයිබර් ආරක්ෂාව සම්බන්ධ අත්‍යාවශ්‍ය අංග පාඨමාලාව | තොරතුරු තාක්ෂණ සහකාර කළමනාකරණ සහකාර | දින 02 | මිලෝදා ඇකඩමි |
| අභිප්‍රේරණ වැඩසටහන | රියදුරන් (21) | දින 01 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යංශය |
| ලිපිගොනු කළමනාකරණය | කළමනාකරණ සහාකාරවරුන් (20) | දින 01 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යංශය |
| අභිප්‍රේරණ වැඩසටහන | කාර්යාල සහායකයින් (18) | දින 01 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යංශය |
| ලිපිගොනු කළමනාකරණය | කළමනාකරණ සහාකාරවරුන් (23) | දින 01 | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යංශය |

## නිලධාරීන් සඳහා උසස් අධ්‍යාපන වැඩසටහන්

| නිලධාරියාගේ නම | තනතුර | පාඨමාලාව | කාලය |
|---|---|---|---|
| පී.බී. මධුර හර්ෂණ මහතා | ස. සාමාන්‍යාධිකාරී (තො.තා.) | තොරතුරු ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි (Master of Information Security) | අවුරුදු 02 |
| ප්‍රසාද් රණසිංහ මහතා | ස. සාමාන්‍යාධිකාරී (මා.ස.) | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි (Master of Human Resources Management) | අවුරුදු 02 |

# 2021.12.31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය

| තනතුර | වැටුප | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත | කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව | අනුයුක්ත කිරීම් විස්තර |
|---|---|---|---|---|---|---|---|
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | | 1 | 1 | | | | |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | | 1 | | 1 | | | |
| සාමාන්‍යාධිකාරී | H.M - 2.1 | 1 | 1 | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | H.M - 1.1 | 1 | 1 | | | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | H.M - 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | M.M-1.1 | 2 | 2 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | M.M- 1.1 | 3 | 2 | 1 | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | M.M- 1.1 | 2 | 1 | 1 | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මා.ස.ක./පරිපාලන) | M.M- 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය) | M.M- 1.1 | 1 | 1 | | | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | M.M- 1.1 | 1 | 1 | | | | |
| අභ්‍යන්තර විගණක | M.M- 1.1 | 1 | 1 | | | | |
| පරිපාලන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රවාහන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| කලාප කළමනාකරු | J.M- 1.1 | 10 | 9 | 1 | | | |
| ගිණුම් නිලධාරී | J.M- 1.1 | 4 | 4 | | | | |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | J.M- 1.1 | 1 | 1 | | | | |
| ප්‍රසම්පාදන නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| මානව සම්පත් නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | J.M- 1.1 | 1 | 1 | | | | |
| අලෙවි ප්‍රවර්ධන සහකාර | MA - 3 | 24 | 16 | 8 | | | |
| තත්ත්ව පාලන සහකාර | MA - 3 | 1 | 0 | 1 | | | |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA - 3 | 4 | 2 | 2 | | | |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | MA-3 | 1 | 1 | | | | |
| ගිණුම් සහකාර | M.A-2.2 | 2 | 0 | 2 | | | |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | MA-1.2 | 1 | 1 | | | | |
| පුද්ගලික සහකාර | MA-1.2 | 1 | 0 | 1 | | | |
| කළමනාකරණ සහකාර | MA-1.2 | 137 | 126 | 9 | | 2 | |
| අලෙවි සම්බන්ධීකාරක | MA-1.1 | 5 | 3 | 2 | | | |
| රියදුරු | P.L - 3 | 43 | 41 | 1 | | 1 | |
| විදුලි කාර්මික | P.L -3 | 2 | 2 | | | | |
| කාර්යාල කාර්ය සහායක | P.L -1 | 65 | 59 | 4 | | 2 | |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | P.L -1 | 10 | 10 | 0 | | | |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | P.L -1 | 6 | 1 | 5 | | | |
| ආරක්ෂක සහකාර | P.L -1 | 3 | 15 | | 12 | | |
| **එකතුව** | | **342** | **310** | **39** | **12** | **5** | |

## කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය

| වයස් කාණ්ඩය | එකතුව |
|---|---|
| 20 - 30 | 50 |
| 31 - 40 | 112 |
| 41 - 50 | 99 |
| 50 ට වැඩි | 54 |
| **එකතුව** | **315** |

| | |
|---|---|
| සභාපති / ප්‍රධාන විධායක නිලධාරී | 1 |
| සාමාන්‍යාධිකාරී | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 2 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 8 |
| අභ්‍යන්තර විගණක | 1 |
| පරිපාලන නිලධාරී | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 |
| කලාප කළමනාකරු | 9 |
| ගිණුම් නිලධාරී | 4 |
| පද්ධති /වැඩසටහන් විශ්ලේෂක | 1 |
| මානව සම්පත් නිලධාරී | 1 |
| ප්‍රසම්පාදන නිලධාරී | 1 |
| ප්‍රවාහන නිලධාරී | 1 |
| අලෙවිකරණ හා ප්‍රචාරණ නිලධාරී | 1 |
| ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධන සහකාර | 16 |
| තො.තා. සහකාර | 2 |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | 1 |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | 1 |
| කළමනාකරණ සහකාර | 128 |
| අලෙවි සම්බන්ධීකාරක | 3 |
| රියදුරු | 42 |
| විදුලි කාර්මික | 2 |
| කාර්යාල කාර්ය සහායක | 61 |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | 10 |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | 1 |
| ආරක්ෂක සහායක | 15 |
| | **315** |

## කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පිරිමි කාර්ය මණ්ඩලය | 221 |
| කාන්තා කාර්ය මණ්ඩලය | 94 |
| | 315 |

# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා වන පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම් වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරිට සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි. 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය වෙයි. මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි පනතේ 3(i) වගන්තිය යටතේ විශේෂිතව දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්

i. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකු
ii. ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු
iii. අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙකු අමාත්‍යවරයා විසින් සභාපතිවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, එම සභාපතිවරයා මණ්ඩලයේ පරිපාලනය කිරීමේ සහ කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන හා ප්‍රධාන විධායක නිලධාරී වන්නේය.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස කොටස් හිමියන් වෙත වාර්තා කිරීම.
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම.
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.

## අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූලව ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මකව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

## සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන සහ කළමනාකරණ කමිටුව
3. ටෙන්ඩර් මණ්ඩල කමිටුව
4. කාර්ය මණ්ඩල සුභසාධක කමිටුව
5. වෙළඳ දැන්වීම් කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික සහ කලා සංගමය

## කළමනාකාරිත්වය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් සභාපති /ප්‍රධාන විධායක නිලධාරීගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථා හඳුනාගෙන නිසි කලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා අයවැය නියම කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කළ යුතු වේ.

## 2021 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 27.01.2021 | අමිත ගමගේ මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 23.02.2021 | අමිත ගමගේ මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | නොපැමිණ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 02.03.2021 | අමිත ගමගේ මහතා | සභාපති /ප්‍ර.වි.නි. | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 25.03.2021 | අමිත ගමගේ මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 30.04.2021 | අමිත ගමගේ මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 19.05.2021 | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | නොපැමිණ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 08.06.2021 | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | නොපැමිණ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 25.06.2021 | අනුෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 08.07.2021 | අනුෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. හද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවින්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |

| | | | |
|---|---|---|---|
| 20.08.2021 | අනූෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 22.10.2021 | අනූෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 29.11.2021 | අනූෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 14.12.2021 | අනූෂ පැල්පිට මහතා | සභාපති / ප්‍ර.වි.නි | ☑ |
| | පේ.එම්. බද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |

## 2021 වර්ෂයේ දී පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව

| රැස්වීමෙහි දිනය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|
| 23.02.2021 | එච්.පී. සුමනසිංහ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 24.08.2021 | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| 05.11.2021 | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| 20.12.2021 | රවීන්ද්‍ර ජේ. විමලවීර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | ජෙනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |

# අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම්ව සිටින අවදානම් මට්ටම් ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහගත ප්‍රවේශයක් සංවර්ධන ලොතරැයි අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ගය විශේෂිත පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාර සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කර ගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ:

## ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම

සෑම තොග මට්ටමකදී ම ත්‍යාගවල සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. අවදානම විය හැක්කේ මුදල් ප්‍රවාහයට බලපෑ හැකි සිදුවීම් ඇතිවීමේ හැකියාව නිසා වැඩි මිල අනුපාතයක් තිබිය හැකි වීමයි. ඉහත සඳහන් කළ අවදානම ආවරණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුද්‍රණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනියි.

## ආර්ථික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන් රටෙහි පවතින ආර්ථික හා දේශපාලන වෙනස්කම් වල අනුබලය මත පදනම් වේ.

## මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ලාභදායීත්වයට හා ඵලදායීතාවයට හානි ගෙන දිය හැකියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිසි රක්ෂණ ආවරණයක් සහතික කිරීම සහ ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

## ද්‍රවශීලතා අවදානම

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් උපයා ගැනීම මගින් ද්‍රවශීලතා අවදානම් ඇති විය හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ මුදල් වත්කම් පවත්වාගෙන යයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නුබුන්වත් වුව ද, මණ්ඩලය ගෙවීමට බැඳී සිටින ගෙවීම් ගෙවිය යුතු අවස්ථාව වන විට ඒවා ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් සම්පත් පවත්වාගෙන යාමට හෝ උත්පාදනය කිරීමට නොහැකි නම්, හෝ එසේ ගෙවීමට හැක්කේ සැලකිය යුතු ලෙස අවාසිදායක තත්ත්වයන් යටතේ පමණක් නම් ද්‍රවශීලතා අවදානම් පැන නගියි.

## මෙහෙයුම් අවදානම

පද්ධති ඇණහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදු විය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කළමනාකාරිත්වය විසින් මෙහෙයුම් ඒකක, ව්‍යාපාර ක්‍රියාවලි සහ මහා පරිමාණ ඒකක පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

## ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම උපායමාර්ගික සහ/හෝ කීර්තිනාම හේතුන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ඇති විය හැකි ආදායම් හිඟයට අදාළ වේ. අනෙකුත් අමතර කරුණු අතර, බාහිර සාර්ව ආර්ථික පරිසරය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෝරාගනු ලබන උපායමාර්ගය සහ මණ්ඩලය ක්‍රියාත්මක වන වෙළඳපොළ තුළ එයට ඇති කීර්තිනාමය මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

## කීර්තිනාම අවදානම

පාර්ශ්වකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානි සිදු වීම හේතුවෙන් කීර්තිනාම අවදානම ඇති විය හැකි අතර, එමගින් ව්‍යාපාර රඳවා තබා ගැනීමට සහ උත්පාදනය කිරීමට ඇති හැකියාව අඩපණ කරයි. විශ්වාසය, පැහැදීම හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය බිඳවැටීමෙන් එවැනි හානියක් සිදුවිය හැකිය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දෘශ්‍ය මාධ්‍ය සහ මහජන බැඳියාව මත විශ්වාසය තබා සිටීම මගින් මණ්ඩලය සැලකිය යුතු කීර්තිනාම පාඩු අවදානමකට ලක් වෙයි. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජන බැඳියාව රඳවා ගැනීම සඳහා ඵලදායී අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර දැඩි පද්ධතික විනිවිදභාවයක් අනුගමනය කරමින් කටයුතු කරයි.

## නීති අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගත නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිළිගත් නීති වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

## තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

# විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනා (04) ගෙන් සමන්විත වේ:

| | |
|---|---|
| රවීන්ද්‍ර විමලවීර මයා | විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපති |
| කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජික |
| ජෙනට් ජයවර්ධන මහත්මිය | විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජික |
| ජේ.එම්. හදානි ජයවර්ධන මහත්මිය | විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජික |

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ , නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් හා පරිපාලන සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

## විගණන කමිටුවේ කාර්යභාරය

පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම් වලට අදාළව සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත:

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිවයන්, විනිශ්වයකිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

2. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව වරින් වර සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

3. අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යුහය, ප්‍රතිපත්ති, රාජකාරි වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

## විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව

2021 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත සඳහන් පරිදි වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | පැමිණීම | නොපැමිණීමේ අවසරය |
|---|---|---|
| එච්.පී. සුමනසිංහ මහතා | 01/01 | නැත |
| කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | 03/03 | නැත |
| රවීන්ද්‍ර ජේ. විමලවීර මයා | 04/04 | නැත |
| ජෙනට් ජයවර්ධන මහත්මිය | 04/04 | නැත |
| ජේ.එම්. හදානි ජයවර්ධන මහත්මිය | 04/04 | නැත |



**රවීන්ද්‍ර ජේ. විමලවීර මයා**
සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව



# මූල්‍ය වාර්තාව

## අන්තර්ගතය


ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

විගණන වාර්තාව 2021 සහ කළමනාකරණය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

අංශමය වාර්තාව

අවසන් ගිණුම් පිළිබඳ සටහන්

දස වසරක සාරාංශය

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීපීඩී/ඊ/ඩීඑල්බී/1/21/එෆ්එස් 1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022 අගෝස්තු 8 දින |

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත : ලේකම්, මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීපීඩී/ඊ/ඩීඑල්බී/1/21/එෆ්එස්1 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2022 අගෝස්තු 18 දින

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ජංගම නොවන වගකීම් යටතේ ඇති සේවක ප්‍රතිලාභ වගකීම් වෙනුවෙන් තබා ඇති ස්ථාවර තැන්පතු සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.838,937 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන වටිනාකමද රු.838,937 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2021 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ ගිණුම තුළ ඇතුළත්ව තිබූ රු.1,757,377 ක් වූ වැඩියෙන් ගිණුම්ගත කර තිබූ ක්ෂයවීම් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ක්ෂයවීම් රු.1,757,377 කින් අඩුවී තිබුණි.

(ඇ) 2018 නොවැම්බර් 08 දින මණ්ඩලය වෙත ලැබී තිබුණ දැනට භාවිතා කරමින් පවතින දිනුම් ඇදීමට යොදාගනු ලබන බෝලවල තත්ත්වය පරීක්ෂා කරන යන්ත්‍රය (Drawing Ball Validation Machine) 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලයේ වත්කමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) රු.1,354,016 ක ගෙවීම පැහැර හැර තිබුණු ණයගැතියෙකු වෙතින් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශවලින් හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) කෙරීගෙන යන වැඩ ගිණුම තුළ දැනට භාවිතා කරමින් පවතින කෑම කාමරය, ගබඩා කාමරය හා තාප්පය නැවත සකස් කිරීම සඳහා 2018 වර්ෂය තුළදී වැය කරන ලද පිළිවෙලින් රු.1,336,676 ක්, රු.246,918 ක් හා රු.145,290 වශයෙන් එකතුව රු.1,583,594 ක් ඇතුළත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අයිතමයන් ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණු මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.1 (ආ), (ඇ), (ඉ) ඡේද වල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදීද ක්‍රියාත්මක කර නොතිබුණි.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව,

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17 (5) වගන්තිය | යම් සංවර්ධන ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබනු තැනැත්තා සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රජය සන්තක වියයුතු අතර, ඉන්පසු එය ජනාධිපති අරමුදලට බැර කළ යුතු වුවත්, 2021 වර්ෂයේදී එසේ නොකර ත්‍යාග සංචිත අරමුදලට ගෙන තිබූ ත්‍යාග ප්‍රමාණය රු.15,341,900 ක් විය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8 වගන්තිය | රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා රු.12 ක මුදලක් පමණක් ගෙවිය හැකි වුවද, කිලෝමීටර් එකක් ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 බැගින් එකතුව රු.3,712,160 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 ඡේදය | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව මණ්ඩලය විසින් රු.250,000 ක ආපදා ණය සීමාව ඉක්මවා නිලධාරීන් 145 දෙනෙකු වෙත එකතුව රු.10,487,342 ක ආපදා ණය ගෙවා තිබුණි. |
| (ඇ) 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පෞද්ගලික බැංකුවක ආයෝජනවල (Repo) 2021 දෙසැම්බර් 31 දිනට රු.4,982,000 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඉ) 2015 ඔක්තෝබර් 26 දිනැති අංක ඩී.එල්.බී/එම්.ටී.කේ/බෙදාහි/චක්‍රලේඛ/2015/14 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ චක්‍රලේඛය | 2021 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා දින 14 ක ප්‍රමාදයකින් පසුව භාරදුන් සහ 2022 ජුනි 28 දින වන විටත් භාරනොදුන් ලොතරැයිපත් 733,238 ක් වෙනුවෙන් එක් ලොතරැයි පොතක් සඳහා අයකර ගත යුතු රු.25 ක් බැගින් එකතුව රු.18,330,950 ක් අයකර ගත් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) ත්‍යාග සඳහා මිලදීගත් රු.775,750 වටිනා මෝටර් බයිසිකල් 03 ක්, වර්ෂ 13 ක කාලයක සිට පැවැත එන එකතුව රු.592,500 ක් වටිනා ත්‍යාග වවුචර්පත් 123 ක් හා ත්‍යාග සඳහා මිලදීගත් එකතුව රු.5,053,530 වටිනා රන් භාණ්ඩ දීර්ඝ කාලයක සිට ත්‍යාග සඳහා භාවිතා නොකර පැවැතුණි.

(ආ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කර තිබුණි. මේ නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 දැනට වර්ෂ 16 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාල මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ අවස්ථා 3 කදී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583 ක් වශයෙන් එකතුව රු.3,626,727 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගොඩනැගිලි සැලැසුම් උපදේශන ගාස්තු අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වර්ෂ 8 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් තුළ අපේක්ෂිත කාර්යයන් ඉටුකරවා ගැනීමකින් තොරව මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයකට රඳවා ගැනීමට මණ්ඩලය විසින් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි.

(ඉ) 2015 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන සඳහා නවාතැන් පහසුකම් ලබා ගැනීමට 2014 වර්ෂයේදී එක් ආයතනයක් හා පුද්ගලයින් තිදෙනෙකු වෙත එකතුව රු.202,800 ක අත්තිකාරම් ගෙවා තිබුණි. වර්ෂ 08 ක කාලයක් මුළුල්ලේ මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයන් වෙත රඳවා ගැනීමට ඉඩ දී තිබුණු අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඊ) කොරෝනා වැනි ව්‍යසන කාලපරිච්ඡේදවලදී භෞතිකව ටිකට්පත් අලෙවි කිරීමේ දුෂ්කරතාවයට යම් විසඳුමක් ලෙස E ටිකට්පත් සංකල්පය යොදා ගෙන තිබුණි. නමුත් 2021 වර්ෂයේදී එක් එක් ලොතරැයියෙන් අලෙවි කළ මුළු ලොතරැයිපත් ප්‍රමාණයෙන් සසිරි ලොතරැයිපත් වලින් සියයට 0.2 ක්ද, සුපර්බෝල් ලොතරැයියෙන් සියයට 0.3 ක්ද, ශනිදා වාසනාව ලොතරැයියෙන් සියයට 0.2 ක් වශයෙන් E ලොතරැයි පත් අලෙවිය අඩු ප්‍රතිශයක් වාර්තා වී තිබීම නිසා E ටිකට්පත් සංකල්පය අසාර්ථක වී තිබුණි.

(උ) මණ්ඩලය විසින් Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා රු.3,275,246 ක් වැය කර තිබුණි. මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ලොතරැයිපත් පෞද්ගලික ආයතන දෙකක් මගින් මුද්‍රණය කරනු ලබයි. එම පෞද්ගලික ආයතන දෙකින් එක් ආයතනයක් විසින් මුද්‍රණය කරනු ලබන ලොතරැයිපත් එම App එක මගින් අලෙවි කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ නිසා APP එක වෙනුවෙන් සිදු කළ වියදම සම්පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඌ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී චිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා රු.38,752,448 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් චිත්‍රාගාරයක් ඉදිකිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු නොකර එය නිෂ්ක්‍රියව පැවැතුණි.

(එ) භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණු රු.8,095,000 වටිනා ඩබල් කැබ් (Mitsubishi 4WD) රථය ස්ථාවර වත්කම් තුළ ඇතුලත්ව ඇති අතර ඒ සඳහා රු.8,095,000 ක්ෂය සඳහා ගිණුම්ගත කර ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණන වාර්තාව 2021 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අවසාන විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර**

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (අ) ජංගම නොවන වගකීම් යටතේ ඇති සේවක ප්‍රතිලාභ වගකීම් වෙනුවෙන් තබා ඇති ස්ථාවර තැන්පතු සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.838,937 ක් වැඩියෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආයෝජන වටිනාකමද රු.838,937 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉහත ස්ථාවර තැන්පතුවෙහි පොළිය 2021.12.31 දිනට ගණනය කිරීමේදී දින ගණනක වෙනසක් සිදු වී ඇත. මෙම ස්ථාවර තැන්පතුව 2021.06.07 සිට 2022.06.07 දක්වා කාලය පවතින බැවින් එය කල්පිරීමේදී බැංකුව විසින් ලබා දෙන පොළිය ගණනය කර වර්ෂ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී මෙම වෙනස නිවැරදි කරනු ලැබේ. |
| (ආ) 2021 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය වෙන් කිරීමේ ගිණුම තුළ ඇතුළත්ව තිබූ රු.1,757,377 ක් වූ වැඩියෙන් ගිණුම් ගත කර තිබූ ක්ෂය වීම් නිවැරදි කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ක්ෂයවීම් රු.1,757,377 කින් අඩු වී තිබුණි. | 2020 දෙසැම්බර් මස 31 දිනට වත්කම් වර්ග 03 ක් යටතේ හඳුනා නොගත් වටිනාකම පහත සඳහන් කර ඇති පරිදි වේ.<br><br>කාර්යාල උපකරණ - 833,138.62<br>පරිගණක - 4,107,599.87<br>ලී බඩු සවිකිරීම් - 2,523,988.16<br>7,464,726.55<br><br>විගණන විමසුමේ සඳහන් වන රු.76,926,815/- ක සමුච්චිත ක්ෂය 2020.01.01 දිනට පැවති ශේෂය වන අතර එදිනට එම වත්කම් සම්බන්ධයෙන් පවතින මුළු පිරිවැය රු.249.046,100/-වේ. මේ අනුව විගණන විමසුමේ පෙන්වා දී ඇති වත්කම් වටිනාකම රු.69,462,088/- ඉක්මවා ක්ෂය ගිණුම්ගත කර නොමැත.<br><br>මෙම විමසුමේ සඳහන් රු.1,757,377 ක ගිණුම් සටහන් සමඟ එකඟ වන අතර මෙම වෙනස සමුච්චිත ක්ෂය ගිණුමේ පැවති වෙනසක් වේ. මෙම වෙනස ප්‍රවර්ථන වර්ෂයේ දී ක්ෂය ගිණුම සහ සමුච්චිත ක්ෂය ගිණුම අතර නිවැරදි කිරීම සිදුකර ඇත.<br><br>LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ප්‍රවර්ථන වර්ෂයට ගිණුම්ගත කරන ලෙස දක්වා ඇත. එබැවින් සමාලෝචිත වර්ෂයට අදාල ගැලපීම් සිදුකර ඇත. (Prospective Recognition) |

| | |
|---|---|
| (ඇ) 2018 නොවැම්බර් 08 දින මණ්ඩලය වෙත ලැබී තිබුණ දැනට භාවිතා කරමින් පවතින දිනුම් ඇදීමට යොදාග නු ලබන බෝලවල තත්ත්වය පරීක්ෂා කරන යන්ත්‍රය (Drawing Ball Validation Machine) 2021 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලයේ වත්කමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2022 ජුනි මස තුළ දී මණ්ඩලයේ වත්කමක් ලෙස ගිණුම් ගත කර ඇත. |
| (ඈ) රු.1,354,016 ක ගෙවීම පැහැර හැර තිබුණු ණයගැතියෙකු වෙතින් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය විසින් නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ වලින් හෙළිදරව් කර නොතිබුණි. | ගුණසේන රංකොත්ගේ මහතාගෙන් අයවිය යුතු රු. 1,354,016 අදාලව බැංකු ඇපකර මගින් ලබා ගැනීම සඳහා වන ලිපි 2019.06.12 සණස බැංකුව උකුවෙල ශාඛාවට ලබා දී ඇත. නමුත් බැංකුව විසින් බැංකු ඇපකර කොන්දේසි උල්ලංඝණය කර ගෙවීම පැහැර හැර ඇත. එබැවින් මණ්ඩලය විසින් මේ වන විට අංක DMR 875/21 නඩුවක් ගොනුකර ඇත. මෙම නඩුව පිළිබඳව 2022 මූල්‍ය ප්‍රකාශවලින් හෙළිදරව් කරනු ලැබේ. |
| (ඉ) කෙරීගෙන යන වැඩ ගිණුම තුළ දැනට භාවිතා කරමින් පවතින කෑම කාමරය, ගබඩා කාමරය හා තාප්පය නැවත සකස් කිරීම සඳහා 2018 වර්ෂය තුළ දී වැය කරන ලද පිළිවෙලින් රු.1,336,676 ක්, රු.246,918 ක් හා රු.145,290 වශයෙන් එකතුව රු.1,583,594 ක් ඇතුළත්ව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අයිතමයන් ප්‍රාග්ධනිත කර ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම සැලසුම් කරන ලද ඉදි කිරීම් සිදු කිරීමේ මූලික කටයුතු වෙනුවෙන් මෙම මුදල් වැය වී ඇත. කෙසේ වෙතත් මෙම කෙරී ගෙන යන වැඩ අවසන් කිරීම සඳහා මෙම වර්ෂයේ අයවැය තුළින්ද මුදල් වෙන් කිරීමක් සිදු කරන ලදී. නමුත් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 04/2022 චක්‍ර ලේඛයේ සඳහන් කර ඇති පරිදි අත්‍යවශ්‍ය නොවන ඉදි කිරීම් තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා ඇත. ඒ අනුව මෙම වසරේද මෙම ඉදි කිරීම් සිදු කිරීමට නොහැකි වන අතර ඉහත චක්‍රලේඛය ලිහිල් කිරීමෙන් පසු අදාල ඉදිකිරීම් කරනු ලැබේ. |

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2. 2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව,

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|---|
| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි සඳහා ත්‍යාග ලබා දීම දෙයාකාරව සිදු කරයි.<br><br>01. ලොතරැයියක ත්‍යාග සඳහා වෙන් කරන අරමුදලෙන් ත්‍යාග ලබා දීම. එලෙස ත්‍යාග ලබා දීමේදී දිනුම් ඇදීන ලද දින සිට 6 මසක් ඇතුලත දිනුම් ලාභීන් ත්‍යාග ලබා ගැනීමට ඉදිරිපත් නොවුන හොත් පනතේ 17 (5) වගන්තිය ප්‍රකාරව එම මුදල් 6 මාසයකට පසුව ජනාධිපති අරමුදලට බැර කරනු ලැබේ.<br><br>02. ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර ත්‍යාග ලබා දීම. ත්‍යාග සංචිත අරමුදලට මුදල් ලැබෙනුයේ ලොතරැයියක ත්‍යාග සඳහා වෙන් කරනු ලබන ත්‍යාග අරමුදලේ ප්‍රතිශතය සහ එම දිනුම් ඇදීමට පසු ජනිත කරනු ලබන ත්‍යාග ප්‍රතිශතය අතර වෙනස ත්‍යාග සංචිත ගිණුමට බැර කළ යුතු අතර එම අරමුදල් භාවිතා කර නැවත ත්‍යාග ලබා දීමට භාවිතා කල යුතු බව පනතේ 18 (3) වගන්තියේ සඳහන් කර ඇත. මෙම විගණන විමසුම මගින් පෙන්වා දී ඇත්තේ එලෙස ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර දෙන ලද ත්‍යාග වල වටිනාකම රු.15,341,900ක් බවය.<br><br>ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර ලබා දෙන ලද ත්‍යාග සඳහා හිමිකම් සඳහා ඉදිරිපත් නොවන ත්‍යාග නැවත එම සංචිත අරමුදලට බැර කල යුතු බවට නියමයක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇත. එහි පිටපතක් මේ සමග අමුණා ඇත. ඒ අනුව මෙම රු.15,341,900ක මුදල ත්‍යාග සංචිත අරමුදලට බැර කර ඇත. |
| (අ) | 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17 (5) වගන්තිය | යම් සංවර්ධන ලොතරැයියක ත්‍යාගලාභීන් නිශ්චය කරනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව ඒ ලොතරැයියේ ඒ ත්‍යාගයට හිමිකම් ලබනු තැනැත්තා සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඒ ලොතරැයියේ ප්‍රදානය කර නොමැති යම් ත්‍යාගයක් රජය සන්තක වියයුතු අතර, ඉන්පසු එය ජනාධිපති අරමුදලට බැර කළ යුතු වුවත්, 2021 වර්ෂයේදී එසේ නොකර ත්‍යාග සංචිත අරමුදලට ගෙන තිබූ ත්‍යාග ප්‍රමාණය රු.15,341,900 ක් විය. | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 8 වගන්තිය | රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරියේ යෙදී සිටින නිලධාරීන් ඔවුන් එම රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා ධාවනය කරනු ලබන වාහනය වෙනුවෙන් එක කිලෝමීටරයක් සඳහා රු.12 ක මුදලක් පමණක් ගෙවිය හැකි වුවද, කිලෝමීටර් එකක ධාවනය සඳහා මණ්ඩලය විසින් අලෙවි කළමනාකරුවන්ට රු.40 බැගින් එකතුව රු.3,712,160ක් ගෙවා තිබුණි. | කලාප කළමනාකරුවන්ගේ මෝටර් රථ භාවිතා කරමින් ඔවුන් විසින්ම ඉන්ධන සපයා ගෙන ධාවනය කිරීම වෙනුවෙන් 1Km සඳහා ඉන්ධන දීමනාව රු.40/- ක් ලෙස ආරම්භයේදී ගෙවනු ලැබුවද වර්තමානයේ මිල ගණන් වැඩි වීම සලකා බලා ප්‍රතිශතාත්මකව එම මිල ගණන් ගලපා වර්තමානයේ 1Km රු.65.25 මුදලක් ගෙවීමට 2022.06.30 වන දින පැවති 266 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 142 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 5.2 ඡේදය | චක්‍රලේඛලේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව මණ්ඩලය විසින් රු.250,000 ක ආපදා ණය සීමාව ඉක්මවා නිලධාරීන් 145 දෙනෙකු වෙත එකතුව රු.10,487,342 ක ආපදා ණය ගෙවා තිබුණි | ආපදා ණය ලබා දීමේදී අනුගමනය කළ යුතු 2008.12.31 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2008 සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 5.2 (III) දරණ චක්‍රලේඛ පරිදි 2022.08.01 දින සිට රු.250,000ක උපරිමයකට යටත්ව ආපදා ණය ලබා දීමට කටයුතු කරනු ඇත. |
| (ඈ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පෞද්ගලික බැංකුවක ආයෝජනවල (Repo) 2021 දෙසැම්බර් 31 දිනට රු.4,982,000 ක් ආයෝජනය කර තිබුණි. | බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ගේ පහසුව වෙනුවෙන් මෙම ගිණුම දිගු කාලයක සිට පවත්වා ගෙන යනු ලබන්නකි. රාජ්‍ය බැංකු දෙකක online පද්ධතිය සමග (LMS Integration) සම්බන්ධ වීමට පෙර බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්හට තම තැන්පතු කිරීමෙන් පසු LMS පද්ධතියට ඇතුළත් කිරීමට අදාල තැන්පතු පත්‍ර Fax කිරීමට සිදු විය. සම්පත් බැංකුව මගින් ලබා දුන් Viewing Facility එක හරහා අප ආයතනයේ කාර්ය මණ්ඩලයට Fax කරවා ගැනීමෙන් තොරව ගිණුම් යාවත්කාලීන කිරීමට හැකි වූ අතර එය බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්හට මද පහසුවක් විය. තවද සම්පත් බැංකුව හරහා ගනුදෙනු කිරීමේ වේලාවන් මතද ප්‍රධාන පෙලේ බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් මෙම ගිණුම භාවිතා කරන ලදී. හුදෙක්ම මෙම ගිණුම දෛනික ලැබීම් වෙනුවෙන් පමණක් මෙම ගිණුම පවත්වා ගෙනයනු ලබයි. දැනට මණ්ඩලය සතු බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින්ගෙන් 30 කට ආසන්න ප්‍රමාණයක් මෙම ගිණුමට මුදල් තැන්පත් කරනු ලබන අතර ඔවුන් විසින් තවදුරටත් සිදු කරනු ලබන ඉල්ලීම මත ගිණුම වසා තැබීම මණ්ඩලයේ දෛනික මුදල් රැස්කිරීමේ කාර්යයට බාධාවක් බවත් එසේ කළහොත් දෛනික බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් විසින් නිරවුල් කළයුතු මුදල් ප්‍රමාණය ඉහල යා හැකි බව නිරීක්ෂණය වේ. |
| (ඉ) | 2015 ඔක්තෝබර් 26 දිනැති අංක ඩී.එල්.බී/එම්.ටී.කේ/බෙදානි/ චක්‍රලේඛ/2015/14 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ චක්‍රලේකය | 2021 ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා දින 14 ක ප්‍රමාදයකින් පසුව භාරදුන් සහ 2022 ජුනි 28 දින වන විටත් භාරනොදුන් ලොතරැයි පත් 733,238 ක් වෙනුවෙන් එක් ලොතරැයි පොතක් සඳහා අයකර ගෙත යුතු රු.25 ක් බැගින් එකතුව රු.18,330,950 ක් අයකර ගත් බව සනාථ කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022.08.10 වන විට ආපසු එවනු නොලැබූ ටිකට් පොත් 42,023 ක ප්‍රමාණයක් ලැබිය යුතුව තිබිණ. අදාල ටිකට් තොගයේ වලංගු මාස 06 කාල සීමාව මේ වන විට ඉකුත්ව ඇති අතර එම ටිකට්පත් අලෙවි වූ බවක් හෝ දිනුම් ප්‍රතිපූර්ණයන් සම්බන්ධ ගැටලුද මණ්ඩලය වෙත වාර්තා වී නොමැත. එබැවින් එම ආපසු එවුම් ටිකට් තොගය නොලැබීමෙන් මණ්ඩලය වෙත සිදුවූ අලාභය ශූන්‍ය ලෙස නිරීක්ෂණය කල හැක.<br><br>මේ අවස්ථාවේ රටේ පවතින ආර්ථික අවපාත තත්වය යටතේ අපහසුතාවයට පත්ව ඇති ලොතරැයි ව්‍යාපාරයේ නියුතු වූවන් මේ හරහා තවත් අසරණ වීමටත් අධෛර්ය වීමත් සිදුවන බැවින් ද එය ක්‍රමිකව ඉහළ යන ටිකට් පත් අලෙවියටත් සෘජුවම බලපෑමක් විය හැකි බවට පෙනී යන හෙයින් ද මෙමගින් මණ්ඩලයට වූ අලාභය ශූන්‍ය බවටද නිරීක්ෂණය වීම හේතුවෙන් ද 2021 ජනවාරි සිට ඔක්තොම්බර් දක්වා කාලයේ ආපසු එවුම් භාර නොදුන් දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ගේ කොමිස් මුදල් කපා නොහැර සහනයක් ලබා දීම සුදුසු බව මණ්ඩලයේ කළමණාකරීත්වය තීරණය කරන ලදී. |

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (අ) ත්‍යාග සඳහා මිලදීගත් රු.775,750 වටිනා මෝටර් බයිසිකල් 03 ක්, වර්ෂ 13 ක කාලයක සිට පැවැත එන එකතුව රු.592,500 ක් වටිනා ත්‍යාග වවුචර්පත් 123 ක් හා ත්‍යාග සඳහා මිලදීගත් එකතුව රු.5,053,530 වටිනා රන් භාණ්ඩ දීර්ඝ කාලයක සිට ත්‍යාග සඳහා භාවිතා නොකර පැවැතුණි. | ත්‍යාග සඳහා මිලදීගත් මෝටර් බයිසිකල් 03 අදාලව 2018.08.23 සුපර් බෝල්, 2018.01.26 කෝටිපති ශනිදා සහ 2020.01.30 සුපර් බෝල් විශේෂ ලොතරැයිපත්වල ත්‍යාග සඳහා ඇතුළත් කල ඒවා වන අතර දිනුම් ඇදීමෙන් මාස 06ක් පසු වී ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවු ත්‍යාග අයිතමයන්ය.<br><br>2019 ඔක්තෝම්බර් මස 24 දින පැවති ත්‍යාග පිළිබඳ කමිටුවේදී මෙම මෝටර් බයිසිකල් විශේෂ ප්‍රවර්ධන ලොතරැයිවල ත්‍යාගයන් ලෙස ලබා දීමට යෝජනා විය. කෙසේ නමුත් විගණන හා කළමණාකරන කමිටුව විසින් මෙම අයිතම ඉදිරි ප්‍රවර්ධන අයිතම සඳහා යොදා ගැනීමට යෝජනා කලද 2021 සහ 2022 වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අලෙවි ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව නොපැවති බැවින් මෙම ත්‍යාග අයිතම නැවත ත්‍යාග සඳහා භාවිතා කිරීමට නොහැකි විය. මෙම යතුරුපැදි කාලයක් ගබඩාවේ තිබූ බැවින් ත්‍යාග සඳහා ලබා දීමේ අපහසුතාවයක් පවතී. 2022 මැයි 30 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි අංක 2022/05/1963 අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රත්‍රිකාවට ලැබී ඇති අනුමැතියට අනුව එම අයිතම අලෙවි කොට එම මුදල් සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ප්‍රකාරව කටයුතු කිරීමට තීරණය කර ඇත.<br><br>ත්‍යාග වවුචර්පත් 123 අදාල මුදල අය කර ගැනිම සම්බන්ධයෙන් ස.තො.ස ආයතනය අයත් වෙළෙඳ අමාත්‍යංශයේ ලේකම්තුමිය වෙත ලිඛිත දැනුවත් කිරීම් කර ඇත. ඒ අනුව මෙම මුදල ස.තො.ස ආයතනය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත ගෙවීම් කරන ලෙස වෙළෙඳ අමාත්‍යංශ ලේකම්තුමිය විසින් ස.තො.ස ආයතනය වෙත ලිඛිතව දැනුවත් කර ඇති නමුත් ඊට යහපත් ප්‍රතිචාරයක් නොදැක්විම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ස.තො.ස ආයතනය දැනුවත් කිරීම් අවස්ථා කිහිපයකදී සිදු කරන ලදි. ඊටද ප්‍රතිචාර නොදැක්වීම හේතු කොට ගෙන මෙම වටිනාකම මුදලින් ගෙවීම් කිරීම වෙනුවට භාණ්ඩ වශයෙන් හෝ මණ්ඩලය වෙත ලබා දෙන ලෙස නැවතත් ලිඛිත දැනුවත් කිරීමක් සිදු කර ඇත. එහිදී ද ස.තො.ස ආයතනය විසින් එකඟතාවයක් මේ වන තෙක් දක්වා නොමැති අතර පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂක ජෙනරාල්තුමා වෙත මේ පිළිබඳව ලිඛිතව දැනුවත් කර ඇති අතර ඒ අනුව ලැබෙන පිළිතුර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>මෙම රන් භාණ්ඩ ත්‍යාග අයිතම ලෙස ලබා දීම සඳහා මිලදී ගන්නා ලදී. නමුත් මාස 06 ක් ඇතුළත ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවු හෙයින් මණ්ඩලයෙහි ඉතිරි වී ඇත. මෙම අයිතමයන් නැවත ත්‍යාග වශයෙන් ලබා දීමට සැලසුම් කල ද රටෙහි පවතින තත්ත්වය හේතුවෙන් 2021 දෙසැම්බර් 20 වන දින පැවති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේ දී තීරණය වුයේ මේ රන් භාණ්ඩ වෙන්දේසි කිරීමටය. 2022 ජනවාරි 25 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදි අංක 2022/01/1902 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ලැබී ඇති අනුමැතියට අනුව 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත හා 2019 ජුනි 17 වන දිනැති අංක ඊ112-19 ලිපිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට නීතිපති දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් නීතිපති උපදෙස් අනුව මෙම රන් කාසි සහ රන් භාණ්ඩ අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම ගිණුම්ගත කරනු ඇත. ඒ අනුව, මෙම රන් භාණ්ඩ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් තක්සේරු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර විවෘත ලංසු කැදවා 2022.08.15 විවෘත කරන ලදී. ඇස්තමේන්තු මිල ගණනට වඩා අවම වටිනාකමක් සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් වීම හේතුකොට ගෙන එම ස්වර්ණාභරණ ලැබී ඇති ලංසු මිල ගණන් මත අලෙවි නොකිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. |

| | |
|---|---|
| (ආ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒක පාර්ශිකව කඩ කර තිබුණි. මේ නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක යන මුදල්වල එකතුව වන රු.5,700,000 දැනට වර්ෂ 16 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | වොක්ෂෝල් විදීයේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය පත් කළ කමිටුවේ නිර්දේශ අනුව කටයුතු කිරීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට 2022.08.01 දිනැතිව ලිපියක් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. නිතිපති දෙපාර්තමේන්තුවේ 2022.08.03 දිනතිව ඉදිරි නිතීමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගොනු අංකය ලැබුණු බවට සටහනක් අප වෙත යොමු කර ඇත. |
| (ඇ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාල මුදල අයකර ගන්නා ලෙස නඩු තින්දුව ප්‍රකාශ වි වර්ෂ 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මෙම මුදල අය කර ගැනීම සඳහා වන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නීතිපති දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි. මෙම මුදල අය කර ගැනීම සඳහා සෘජු පාර්ශවකරු වන අමීන් මහතා මේ වන විට මිය ගොසේ ඇති බැවින් ඔහුගේ පුතා සහ බිරිඳ මෙම නඩුවට සම්බන්ධ කර ගැනීම සිදු කර ඇති අතර ඔවුන් වෙත මෙම මුදල ගෙවන ලෙස එන්තර වාසියක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් යොමු කර ඇති බව 2022/07/17 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. |
| (ඈ) 2013 වර්ෂයේ අවස්ථා 3 කදී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583 ක් වශයෙන් එකතුව රු.3,626,727 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගොඩනැගිලි සැලැසුම් උපදේශන ගාස්තු අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වර්ෂ 8 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් තුළ අපේක්ෂිත කාර්යයන් ඉටුකරවා ගැනීමකින් තොරව මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයකට රඳවා ගැනීමට මණ්ඩලය විසින් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි. | ඉහත ආයතනය මගින් සැලසුම් සකස් කිරීමෙන් පසුව එම ඉදිකිරීම සිදු කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් විවිධ අවස්ථා වලදී පාලන අධිකාරීන් වෙනස් වීම නිසා එම ඉදිකිරීම් ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වේ. නමුත් 2022 වර්ෂයේදී මෙම ඉදිකිරීම් සිදු කිරීමට වාර්ෂික අයවැය මගින් මුදල් වෙන් කරන ලදී. එහෙත් ජාතික අයවැය චක්‍රලේඛ 02/2022 හා PDF/04/2024 චක්‍රලේඛ වලින් අත්‍යාවශ්‍ය නොවන ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවීම දැනුම් දීම හේතුවෙන් මෙම ඉදිකිරීම් සිදු කර නොමැති බව මෙයින් දන්වමි. ඉහත චක්‍රලේඛයේ කොන්දේසි ලිහිල් කල පසු අදාල සැලසුම් අනුව ඉදිකිරීම් කිරීමට යෝජිතය. |
| (ඉ) 2015 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන සඳහා නාතැන් පහසුකම් ලබා ගැනීමට 2014 වර්ෂයේදී එක් ආයතනයක් හා පුද්ගලයින් තිදෙනෙකු වෙත එකතුව රු.202,800 ක අත්තිකාරම් ගෙවා තිබුණි. වර්ෂ 08 ක කාලයක් මුළුල්ලේ මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයන් වෙත රඳවා ගැනීමට ඉඩ දී තිබුණු අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | 2022/08/17 දිනැතිව මේ සම්බන්ධයෙන් කොම්පඤ්ඤ විදීය පොලිස් ස්ථානයෙන් පැමිණිල්ලක් ගොනු කරන ලද අතර එහිදී එක් පාර්ශවයක් පමණක් පැමිණ අදාළ මුදල් ගෙවීම මෙම අවස්ථාවේ සිදු කළ නොහැකි බව දැන් වු අතර ඒ සම්බන්ධයෙන් ලිඛිත දැනුම් දීමක් සිදු කරන බවට පවසා ඇත. අනෙක් පාර්ශවයන් සම්බන්ධයෙන්ද අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. |

| | |
|---|---|
| (ඊ) කොරෝනා වැනි ව්‍යසන කාලපරිච්ඡේදවලදී භෞතිකව ටිකට්පත් අලෙවි කිරීමේ දුෂ්කරතාවයට යම් විසඳුමක් ලෙස E ටිකට්පත් සංකල්පය යොදා ගෙන තිබුණි. නමුත් 2021 වර්ෂයේදී එක් එක් ලොතරැයියෙන් අලෙවි කළ මුළු ලොතරැයිපත් ප්‍රමාණයෙන් සසිරි ලොතරැයිපත් වලින් සියයට 0.2 ක්ද, සුපර්බෝල් ලොතරැයියෙන් සියයට 0.3 ක්ද, ශනිදා වාසනාව ලොතරැයියෙන් සියයට 0.2 ක් වශයෙන් E ලොතරැයි පත් අලෙවිය අඩු ප්‍රතිශයක් වාර්තා වී තිබීම නිසා E ටිකට්පත් සංකල්පය අසාර්ථක වී තිබුණි. | මෙම Mobile App එක ශ්‍රී ලංකා මහා බැංකුවේ මාර්ගෝපදේශ වලට යටත්ව නිර්මාණය කර ඇති අතර එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී එය භාවිතා කිරීමට පෙලඹෙන පාරිභෝගිකයන් එක වර on board වීමට අපහසුවක් පෙන්නුම් කරයි. එයට හේතුව නම් මහා බැංකුව මගින් ලබා දී ඇති නියාමනයන්ට අනුව Application එක නිර්මාණය කර ඇති බැවින් මෙය user friendly ලෙස නැවත සකස් කිරීමට මහා බැංකුව සමග කටයුතු කරමින් සිටින අතර එය නිම වීමෙන් පසු විධිමත්ව ප්‍රවර්ධනය කර නව පාරිභෝගික පිරිස් මේ සඳහා සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇත. |
| (උ) මණ්ඩලය විසින් Sweep App හරහා ලොතරැයිපත් නිකුත් කිරීම සඳහා රු.3,275,246 ක් වැය කර තිබුණි. මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන ලොතරැයිපත් පෞද්ගලික ආයතන දෙකක් මගින් මුද්‍රණය කරනු ලබයි. එම පෞද්ගලික ආයතන දෙකින් එක් ආයතනයක් විසින් මුද්‍රණය කරනු ලබන ලොතරැයිපත් එම App එක මගින් අලෙවි කිරීමට එම පෞද්ගලික ආයතනය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. මේ නිසා APP එක වෙනුවෙන් සිදු කළ වියදම සම්පූර්ණ ලෙස ප්‍රයෝජනයට ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. | නව ටිකට් මුද්‍රණ ටෙන්ඩර් කැඳවීමට අනුව අදාල ටිකට්පත මුද්‍රණ සැපයුම්කරුවන් විසින් සෑම ටිකට්පතක්ම ජංගම දුරකථන යෙදවුම හරහා අලෙවි කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත. ඒ අනුව ඔක්තෝම්බර් මාසය වන විට සියලු ටිකට්පත් Sweep App හරහා අලෙවි කිරීමේ සියලු කටයුතු සුදානම් කර ඇත. |
| (ඌ) මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී චිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා රු.38,752,448 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් චිත්‍රාගාරයක් ඉදිකිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු නොකර එය නිෂ්ක්‍රියව පැවැතුණි. | 2021.11.29 දිනැති පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් දන්වා සිටියේ මෙම චිත්‍රාගාරය තුළ රූපවාහිනී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන් පටිගත කිරීම පූර්ණ පහසුකම් නොමැති බැවින් මෙම චිත්‍රාගාරය ශ්‍රවණාගාරයක් ලෙස පවත්වාගෙන යාමට අනුමැතිය හිමි වී ඇත. මේ සම්බන්ධයෙන් 2022.03.10 දින පැවති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව Cope කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි රූපවාහිනී සංස්ථාවෙන් මෙම චිත්‍රාගාරයෙහි රූපවාහිනී වැඩසටහන් පටිගත කිරීමට පවතින හැකියාව සම්බන්ධයෙන් පිරිවැය වාර්තාවක් කැඳවන ලදී. (2022.5.30 දිනැතිව) නමුත් එහිදී නිරීක්ෂණය වුයේ ලොතරැයි දිනුම් ඇදීම සඳහා දැනට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව වෙත යන පිරිවැයට වඩා වැඩි පිරිවැයක් මෙම මැදිරිය තුළ පටිගත කිරීමට වැය කළ යුතු බැවින් ආර්ථික වශයෙන් මණ්ඩලයට ලාභදායි නොවන බව නිරීක්ෂණය විය. |
| (එ) භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණු රු.8,095,000 වටිනා ඩබල් කැබ් (Mitsubishi 4WD) රථය ස්ථාවර වත්කම් තුළ ඇතුලත්ව ඇති අතර ඒ සඳහා රු.8,095,000 ක්ෂය සඳහා ගිණුම්ගතකර ඇත. | මෙම වත්කම මණ්ඩලය මගින් ලියාපදිංචි කර ඇති නිසා වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇත. එබැවින් ක්ෂය ප්‍රතිපාදන සිදු කර ඇත. |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2021 රු. | 2020 රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | **15,364,398,498** | 15,033,029,360 |
| ටිකට්පත් පිරිවැය | 02 | **433,523,004** | 451,308,013 |
| ත්‍යාග ගෙවීම | 03 | **7,865,640,218** | 7,702,515,219 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | **542,022,297** | 509,983,411 |
| **දළ ලාභය** | | **6,523,212,978** | 6,369,222,716 |
| වෙනත් ආදායම් | 05 | **110,304,701** | 158,323,671 |
| බෙදාහැරීම් පිරිවැය | 06 | **3,484,491,585** | 3,357,266,425 |
| පරිපාලන වියදම් | 07 | **536,791,467** | 506,926,732 |
| **මෙහෙයුම් වියදම්වලින් පසු අතිරික්තය** | | **2,612,234,628** | 2,663,353,230 |
| මූල්‍ය පිරිවැය | 08 | **936,549** | 382,172 |
| ලබා නොගත් ත්‍යාග | | **342,230,480** | 330,530,580 |
| **බදු පෙර ලාභය** | | **2,953,528,558** | 2,993,501,638 |
| ආදායම් බදු | 09 | **83,440,185** | 10,921,555 |
| **ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය** | 10 | **2,870,088,373** | 2,982,580,083 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | 17.1 | **5,863,008** | (3,139,116) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 39,213,944 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **2,875,951,381** | 3,018,654,911 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.



**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)



**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී



**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | 11 | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | **1,138,357,289** | 1,192,868,608 |
| ප්‍රග්ධන නොනිම් වැඩ | | **2,778,884** | 37,729,237 |
| **අස්පෘශ්‍ය වත්කම්** | 11 | **17,539,784** | 6,051,604 |
| | | **1,158,675,958** | 1,236,649,449 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,158,675,958** | 1,236,649,449 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | **43,102,269** | 32,590,632 |
| වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු | 14 | **150,441,764** | 92,541,218 |
| පූර්ව ගෙවීම් සහ තැන්පතු | 15 | **11,141,943** | 8,197,378 |
| ස්ථාවර තැන්පතු | 12 | **1,142,259,436** | 1,338,731,761 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | **900,006,350** | 541,662,763 |
| **මුළු ජංගම වත්කම්** | | **2,246,951,762** | 2,013,723,752 |
| **මුළු වත්කම්** | | **3,405,627,719** | 3,250,373,201 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | |
| **දායක කළ ප්‍රාග්ධනය** | | | |
| ජනාධිපති අරමුදල | | **2,200,000** | 2,200,000 |
| මහපොල භාර අරමුදල | | **2,200,000** | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | | **448,131,648** | 698,558,607 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | | **564,219,473** | 685,860,083 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | **614,729,237** | 614,729,237 |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | | **2,723,891** | (3,139,116) |
| **මුළු ස්කන්ධය** | | **1,634,204,250** | 2,000,408,811 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 17 | **(9,372)** | 3,636,437 |
| ගෙවිය යුතු අලෙවි නියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත තැන්පතු | 18 | **37,664,881** | 36,390,381 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **37,655,509** | 40,026,818 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 19 | **640,706,596** | 516,032,675 |
| ගෙවිය යුතු ත්‍යාග | 20 | **962,793,104** | 578,618,857 |
| ගෙවිය යුතු ණය වට්ටර් | | **130,268,260** | 115,286,040 |
| **මුළු ජංගම වගකීම්** | | **1,733,767,960** | 1,209,937,573 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **3,405,627,719** | 3,250,373,201 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ඩබ්.ඒ.වී.සී. සෝමරත්න**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**අජිත් ගුණරත්න නාරගල**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

**ජෙනට් ජයවර්ධන**
අධ්‍යක්ෂ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2021<br>රු. | 2020<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 2,953,528,558 | 2,993,501,638 |
| **ගැළපීම්** | | | |
| ස්ථාවර වත්කම් මත අගය ක්ෂය කිරීම | | 85,621,228 | 81,003,610 |
| ත්‍යාග සංචිත ගිණුම | | (250,426,959) | (404,638,678) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 8,787,447 | 8,615,668 |
| ගෙවන ලද පාරිතෝෂික | | (2,440,010) | (612,535) |
| පොළී ආදායම | | (101,048,159) | (151,670,804) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය | | (2,000) | (501,217) |
| ගෙවන ලද ආදායම් බදු | | (653,294) | |
| ගෙවන ලද පෙර වර්ෂ සඳහා ආදායම් බදු | | | (88,020,107) |
| ජනාධිපති අරමුදලට ගෙවන ලද මුදල් | | (2,991,728,983) | (2,774,512,667) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | (298,362,171) | (336,835,092) |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| බඩු තොග වැඩිවීම/අඩුවීම | | (10,511,637) | 18,435,572 |
| ණය ගැතියන් වැඩිවීම/අඩුවීම | | (57,379,665) | 41,830,116 |
| තැන්පතු හා පෙරගෙවුම් වැඩිවීම/අඩුවීම | | (2,944,565) | (2,985,107) |
| **මෙහෙයුම් වගකීම් වැඩිවීම/අඩුවීම** | | | |
| ණය හිමියන් වැඩිවීම/අඩුවීම | | 65,157,266 | 888,914 |
| ගෙවිය යුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම | | 384,174,247 | (182,175,346) |
| ත්‍යාග වවුචර් අඩුවීම | | 14,982,220 | (45,261,820) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 95,115,695 | (506,102,764) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදුවූ මුදල් ගලනය** | | | |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය ලැබීම් | | 26,027,222 | 16,751,788 |
| කාර්ය මණ්ඩලයට ලබාදුන් ණය | | (26,548,102) | (25,110,242) |
| ස්ථාවර වත්කම් එකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ) | | (30,917,973) | (4,102,154) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය (දේපළ, පිරියත සහ උපකරණ) | | 2,000 | 501,217 |
| පොළී ආදායම | | 101,048,159 | 151,670,804 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජන | | 192,342,087 | 112,108,066 |
| බෙදාහැරීම් අලෙවි නියෝජිත තැන්පතු වල වැඩි වීම | | 1,274,500 | 280,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් සිදුවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 263,227,892 | 252,099,479 |
| | | 358,343,587 | (254,003,285) |
| මුදල්, මුදල් සහ මුදල් හා සමාන දෑ වැඩිවීම/අඩුවීම | | 358,343,587 | (254,003,285) |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 541,662,763 | 795,666,048 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 900,006,350 | 541,662,763 |
| බැංකුවේ ඇති මුදල් — ලංකා බැංකුව | | 347,366,305 | 326,599,529 |
| මහජන බැංකුව | | 544,886,006 | 208,778,128 |
| සම්පත් බැංකුව | | 7,297,345 | 5,486,920 |
| හැටන් නැෂනල් බැංකුව | | 447,290 | 783,781 |
| | | | |
| අත ඇති මුදල් | | 9,404 | 14,404 |
| | | 900,006,350 | 541,662,763 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | ජනාධිපති අරමුදල සහ මහපොල භාර අරමුදල | ත්‍යාග සංචිත ගිණුම | රඳවාගත් ඉපැයීම් | ප්‍රත්‍යාගණන සංචිතය | සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2020.01.01 දිනට ශේෂය | 4,400,000 | 1,103,197,285 | 477,792,667 | 575,515,293 | | 2,160,905,245 |
| 2020 වර්ෂය තුළ එකතු කිරීම් | | (404,638,678) | 2,982,580,083 | 39,213,944 | (3,139,116) | 2,614,016,233 |
| ජනාධිපති අරමුදලට විසර්ජනය කිරීම | | | (2,774,512,667) | | | (2,774,512,667) |
| **2020.12.31 දිනට ශේෂය** | **4,400,000** | **698,558,607** | **685,860,083** | **614,729,237** | **(3,139,116)** | **2,000,408,811** |
| 2021 වර්ෂය තුළ එකතු කිරීම් | | (250,426,959) | 2,870,088,373 | | | 2,619,661,415 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | | | | 5,863,008 | 5,863,008 |
| වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට ගෙවීම් | | | (2,991,728,983) | | | (2,991,728,983) |
| **2021.12.31 දිනට ශේෂය** | **4,400,000** | **448,131,648** | **564,219,473** | **614,729,237** | **2,723,891** | **1,634,204,250** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ ආයතනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලදී. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02 වේ. මෙම වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම වූයේ ලොතරැයි අලෙවි කිරීමයි.

## 2. සකස් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද, මෙහි මින් මතු SLFRS/LKAS යනුවෙන් හඳුවන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වල සහ පරිපාලන රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

### 2.2. මිනුම් කිරීමේ පදනම

පහතින් දක්වා ඇති පරිදි හැරෙන්නට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කර ඇත:

**ස්ථාවර තැන්පතු මත ආයෝජන**
- සාධාරණ වටිනාකමට

**ඉඩම් සහ ගොඩනැගිලි**
- ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට

**පාර්තෝෂික සඳහා වෙන්කිරීම්**
- පාර්තෝෂික සූත්‍රය සහ නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකමට

### 2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

### 2.4. නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2022 පෙබරවාරි 25 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය දී ඇත.

### 2.5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා කරනු ලබන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව සිදු කර ඇත. එබැවින් සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වී ඇති උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ සහ එය බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබේ.

### 2.6. ප්‍රමාණවත් බව හා සමාහරණය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සෑම සමාන අයිතම වර්ගයක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතම ද ප්‍රමාණාත්මක නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගන්නා ලද ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව හිලව් කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමකින් පියවීම සඳහා හෝ එක විට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමට අභිප්‍රායයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර දී ඇත්තේ නම් මිස, සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත වශයෙන් අනාවරණය කර ඇති පරිදි, ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හිලව් නොකරනු ලැබේ.

### 2.7. ආදායම් බදු

මණ්ඩලය ආදායම් බදු වලට සහ අගය එකතු කළ බද්ද හා රඳවාගැනීමේ බද්ද ඇතුළු අනෙකුත් බදු වලට යටත් වේ. මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුගත කර ගැනීම පිළිපැදීම පිළිබඳ බදු මාර්ගෝපදේශ නිකුත් කරන තුරු ප්‍රවර්තන සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදන පිළිබඳව සහ බදු පැනවීමේ කාර්යය සඳහා බදු අය කළ හැකි ලාභය පිළිබඳව තීරණය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී බදු නීති අදාළවීම පිළිබඳ අර්ථ නිරූපණයට අදාළ අවිනිශ්චිතතාවයන් පවතී. 2019 වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු සහ වැට් බදු තක්සේරු 7 ක් නිකුත් කර ඇත. මණ්ඩලය අභියාචන ඉදිරිපත් කර විරෝධය දක්වා ඇත. එකී තක්සේරු කිරීම් වලින් විශාල වගකීමක් පැන නොනගිනු ඇති බව මණ්ඩලයේ මතය වේ. එකී තක්සේරු කිරීම් මේ වන තෙක් අවසන් කර නැත.

කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තක්සේරු අංක 0201617002 සඳහා තීන්දුවක් නිකුත් කර ඇත. 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතෙහි 7 වැනි වගන්තිය ප්‍රකාරව මණ්ඩලය නැවතත් බදු අභියාචනා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

තක්සේරු කරන ලද වටිනාකමෙන් 25% ක් වූ මුදලක් ආපසු ගෙවිය යුතු බැංකු ඇපකරයක් ලෙස ඉදිරිපත් කළ යුතු යැයි එකී පනත මගින් නියම කර තිබේ. ඒ අනුව මණ්ඩලය ස්ථාවර තැන්පතුවක් විවෘත කිරීම හරහා රු. 37,575,693.25 ක බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ඇති අතර, සටහන් අංක 12 - ස්ථාවර තැන්පතු යටතේ පෙන්වා ඇත.

### 2.8. අඛණ්ඩ භාවය

පූර්වේක්ෂ අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මණ්ඩලය සතුව සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වේ. තවද, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස මණ්ඩලයට අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලය නොදන්නා අතර, මණ්ඩලය ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට මණ්ඩලය අදහස් නොකරයි. එම නිසා, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අඛණ්ඩ භාවය පදනම් කර ගෙන අඛණ්ඩව සිදු කරනු ලැබේ.

### 2.9. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය

සෑම වාර්තාකරණ දිනයක දී ම මණ්ඩලය වත්කම්වල අවශේෂ්‍ය වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී කළමනාකාරීත්වයේ විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර, එබැවින් ඒවා අවිනිශ්චිතතාවයකට භාජනය වේ.

## 3. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1. දේපළ, පිරියත සහ උපකරණ

#### 3.1.1. හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම සඳහා හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ඇති ස්පෘශ්‍ය අයිතම වන අතර ඒවා එක් කාල පරිච්ඡේදයකට වඩා වැඩි ගණනක් තුළ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

**(අ) හඳුනා ගැනීම**

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ඒවා දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ.

**(ආ) මැනීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට හෝ තක්සේරු කළ අගයට සඳහන් කරනු ලැබේ.
වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් පිරිවැය යන්නට ඇතුළත් වේ. ස්වයංව ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට එම ඉදිකිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයෙහි පිරිවැය, එම වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාත්මක තත්වයකට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි අනෙකුත් වියදම් සහ භාණ්ඩ කොටස් වලට ගලවා ඉවත් කර ඒවා පිහිටා තිබූ භූමිය යළි යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරනු ලබන වියදම් එම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

**(ඇ) පසුකාලීන වියදම්**

දීර්ඝ පරීක්ෂා කිරීමේ සහ අලුත්වැඩියා වියදම් ද ඇතුළුව වෙන වෙනම ගිණුම් ගත කර ඇති දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනිත කරනු ලැබේ. යම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ එහි පිරිවැය විශ්වසානීය ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගයෙහි හඳුනාගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටසෙහි ධාරණ අගය ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගෙන ඇත.

